11. Available at <https://www.livehistoryindia.com/snapshorthistories / 2017/12/20/ ravanhatta- --of-bardsvillains>, accessed December 02, 2018.

His music records were widely sold and, by March 2015 as a newspaper article mentions, "Dinesh Subasinghe has set a record by creating the highest selling instrumental music compact disc (CD) titled 'Rawan Naada' in Sri Lanka".

The recent web article "ravanhatta of bards and villains" written by Leora Pezarkar (2017) is a compilation of previous information available online. It provides incomplete bibliographical information to justify the statements. The website is about stories in India as if the author attempts to persuade the readers that *ravanhatta* is rather Indian than Sri Lankan by simply mentioning "However, there is no historical record of such an instrument ever existing in Sri Lanka". Most of the text is about the stories of *ravanhatta* in an Indian context.

Now, considering all the misinformation, speculation, and twisting with conservative colonial classification systems coming from India and the some Western sources, the questions remaining in order to evaluate any online content regarding this topic are:

- What is said about instrumental music in Sri Lanka?
- What is said about the origin of the instrument in question?
- How is this claim supported?
- Is the visual support convincing?
- What is the main goal to have put this information in the context of any digital platform?

CONCLUSION

The main reason for inventing a history and a cultural belonging is a questionable national pride in specific achievements. The colonial period in Sri Lanka ended long time ago, however, the way how cultural features of powerful colonizers were admired and appropriated among the upper layers of the society has still an impact on dealing with a limited awareness for regional culture and nationhood.

The perception of the *ravanhatta* is a good example to show the difficulties that come with an introvert understanding of the culture within a modern nation. The following scheme on Figure 8 can illustrate the ways of thinking.



Figure 8: Scheme of perpetuating reasons for cultural nationalism and the subsequent impact on educational goals within humanities.

In the end, when the turning point of understanding differences becomes productive, the singularity of cultures must be questioned. If all cultural achievements are a result of giving them meaning in different ways, the single origin must be finally limited to some very few elements within an entity. This applies on big nations as well as on small musical instruments. To say it simpler, a pure culture that creates out itself novelties may not really exist since it is always the sum of all activities in the geographical space and the time given. The popularity of the *ravanhatta* in Sri Lanka is a novelty though the instrument might have been known from various occasions either in India, Persia, or the Middle East, yet it is not a discovery of any origin. The example of the *ravanhatta* shows the necessity of dynamic meanings within a large region and, in contrast, the effect of misinformation through short sighted policy making. In this context the following questions have to be raised:

We have to explain why true facts are not popular compared to the made-up stories and why scholars are obviously not "grounded" enough in order to reach out and to present research outcomes in a convincing way.

Also, what can be suggested in order to make a difference in the future by increasingly using digital media?

So far, digital media work for misinformation or perpetuation of nationalistic and also for progressive goals. On the one hand, they help to re-produce colonial thinking and self-colonizing life patterns. On the other hand, they also become evidences for these issues, so that they will be discussed as here in this paper. The future has to use digital media on a higher level of understanding and scholars have to be among the first in revealing the true technological forces of those media for the benefit of a better distribution of knowledge. Therefore, there is no end of thinking in a larger vision.

REFERENCES

Asiatic Society of Bengal. 1799. *Asiatic researches or transactions of the Society instituted in Bengal, for inquiring into the history and antiquities, the arts, sciences, and literature, of Asia* 3. Asiatic Society of Bengal. J. Sewel.

Bor, Joep. 1986. "The Voice of the Sarangi: An Illustrated History of Bowing in India". *National Centre for the Performing Arts Quarterly Journal* 15 (3, 4), Bombay. Bulletin of the Madras Museum. 1956. Vol. 4. New Series.

Engel, C. 1874. *Catalogue of Musical Instruments in the South Kensington*

Museum. London.

Fetis, F. J. 1869. *Histoire Generale de la Musique*. Paris: Firmin Didot frères, fils et cie.

Herath, Uthpala, and Anusha Gajaweera. 2015. "Violin Reflects the Impact: A Music Iconological Study through the 19th and 20th Century Buddhist Temple Murals in Sri Lanka Under the British Colonialism". In *International Conference on Interdisciplinary Research and Development*, 272–80. Chiangmai, Thailand.

Heron-Allen, Edward. 1885. *Violin-making: as it was and is, being a historical, theoretical, and practical treatise on the science and art of violin-making, for the use of violin makers and players, amateur and professional*. London: Ward, Lock, and Co.

Hubele, Michelle. 2007. "Lessons on Devotion: A Convergence of Christian and Hindu Religiosity". *Boston College Undergraduate Research Journal* 4 (1): 16–26.

Jered, Patrick. 2015. *Finding the Demon's Fiddle*. Tranquebar: Tranquebar Press.

Mahanama.1912. *Mahavamsa: the great chronicle of Ceylon*. Translated by Wilhelm Geiger e Mabel Haynes Bode. London: Pali Text Society by Oxford University.

Pezarkar, Leora. 2017. "Ravanhatta - Of Bards & Villains". *Live History India* (blog). December 20, 2017. https://www.livehistoryindia.com/snapshort¬histories/2017/12/20/ravanhatta---of-bards¬villains. Acessed December 8, 2018.

Sen, Tansen. 2015. "The Spread of Buddhism." In *The Cambridge World History*, edited by B. Kedar and M. Wiesner-Hanks, 447–80. Cambridge: Cambridge University Press.

Sonnerat, Pierre. 1782. *Voyages Aux Indes et a La Chine*. Paris.

Svayambhudeva. 2018. The Life of Padma. Translated by Eva De Clercq. *Murty Classical Library of India* 17. Cambridge: Harvard University Press.

Swami Prajnanananda. 1981. *A Historical Study of Indian Music*. New Delhi: Munshiram Manoharlal.

Buddhaghosa. 1930. Samantapsāsādikā: Buddhaghosa's Commentary on the Vinaya Pitaka. Edited by Takagusu J. and Makoto Nagai. *Pali Text Society* 3. London: Pali Text Society.

Bāna, Vāmana Bhatta. 1910. Vemabhupala Charitam. *Sri Vani Vilas Sanskrit Series*. Sri Vani Vilas Press.

එස්. එම්. දුලාරී ගයත්‍රිකා සූරියබණ්ඩාර
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

යටත්විජිත ශ්‍රී ලාංකේය වාර්තා ඡායාරූපවල නිරූපිත ස්වදේශික දේහය පිළිබඳ අධ්‍යයනයක් (ක්‍රි.ව. 1843-1948)

සංක්ෂේපය

ස්වදේශිකයා අරමුණු කරගත් ඡායාරූප ශ්‍රී ලාංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ සමාජ දේශපාලනික පසුබිම, කතිකාවත් සහ අධිපති මතවාද අධ්‍යයනයේ දී ඉතා වැදගත් දෘශ්‍ය මූලාශ්‍රයකි. මෙම ඡායාරූපවල එකල ලංකාවේ ජීවත් වූ සිංහලයින් ඇතුළු විවිධ ස්වදේශික ජන කණ්ඩායම් පිළිබඳව සැලකිය යුතු දෘශ්‍යමය දත්ත ප්‍රමාණයක් අන්තර්ගත වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ කේන්ද්‍රීය අවධානය යොමු වූයේ ක්‍රි.ව 1843 සිට 1948 දක්වා කාලය තුළ ශ්‍රී ලාංකේය යටත්විජිත ඡායාරූපයේ ස්වදේශික දේහය නිරූපණය වූයේ කෙසේද? සහ එම නිරූපණයන්ගෙන් මතුවන යටත්විජිත කතිකාවත් සහ එයින් ඇඟවෙන යටත්විජිතකාරක බල පද්ධතීන් කවරේද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම ප්‍රධාන ගැටළුවෙන් පැන නඟින ද්විතීක ගැටළු ලෙස; යටත්විජිත ඡායාරූපකරණයේ අරමුණු මොනවාද?; ස්වදේශික දේහය ඡායාරූපයට අරමුණු කර ගැනීමේ සුවිශේෂතා කවරේද?; එකී ස්වදේශිකයන් කවර සමාජ ස්ථර නියෝජනය කරන්නේද?; සහ ස්වදේශික ශරීරය නිරූපණ විෂයේ බලපෑ සමාජ-දේශපාලනික ගතිකයන් මොනවාද? යන උප ගැටළු කෙරෙහි ද මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු විය. ක්‍රි.ව 1843 - 1948 කාල පරිච්ඡේදය තුළ ස්වදේශිකයන්

ප්‍රමුඛ පද

ස්වදේශික දේහය, බ්‍රිතාන්‍ය යටත්විජිත යුගය, අනෙකා, ප්‍රාචීනවාදය, යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය

අරමුණු කරගනිමින් නිමවුණු යටත්විජිත ඡායාරූප 100ක නියැදියක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදි. අධ්‍යයනයට යටත් දෘශ්‍යමය කියැවීම් සඳහා මූලිකවම භාවිතා වූයේ පශ්චාත් යටත්විජිතවාදී න්‍යායාත්මක ප්‍රවේශයයි. එමෙන්ම යටත්විජිත ඡායාරූපය තුළ ස්වදේශික දේහයේ හැසිරවීම ඔස්සේ පිළිබිඹුවන යටත්විජිතවාදී අභිමථාර්ථ හා සංකේතාර්ථ අවබෝධ කර ගැනීම සඳහා සංඥාර්ථවේදී හා පශ්චාත් ව්‍යුහවාදී න්‍යායාත්මක ප්‍රවේශ ද වැදගත් විය. එහි දී ඡායාරූප තුළ ස්වදේශික ශරීරයේ ස්ථානගත වීම, ඉරියව් නිරූපණය, වස්ත්‍රාභරණ දැක්වීම, පසුබිම් සංරචනය යනාදී දෘශ්‍ය කේතයන් පිළිබඳව අවධානය යොමු කරන ලදි. එසේම 'අනෙකා', ප්‍රාචීනවාදය, නිර්-ප්‍රභූ, බලය සහ කුලය යන සංකල්පීය තත්ත්වයන්ගේ බලපෑම පිළිබඳව ද විමර්ෂණයට ලක්වියග අධ්‍යයන ප්‍රතිඵල අනුව බහුතරයක් ඡායාරූපවල ස්වදේශික දේහය පහත් නොදියුණු යන යුරෝ-කේන්ද්‍රීය මතවාදය තුළ ස්ථානගත කර තිබෙන අතර ඇතැම් ඡායාරූප තුළ ස්වදේශික ශරීරය යුරෝපීයාගෙන් වෙනස් 'අපූර්ව' යන ප්‍රාචීනවාදී ඇඟවුම් පිළිඹිබු කිරීම සඳහා අරමුණු කර තිබෙන බව නිගමනය කළ හැකිය.

හැඳින්වීම

යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය ඡායාරූප ශිල්පීන් රැසක් ශ්‍රී ලංකාවට පැමිණ ස්වදේශික භූමිය හා යටත්වැසියන් පිළිබඳව දෘශ්‍යමය තොරතුරු වාර්තා කර තිබේ. මෙම දෘශ්‍යමය වාර්තා විජිතවාදීන්ගේ අවශ්‍යතාවයක ප්‍රතිඵලයකි. මුල් කාලීනව දළ සටහන් (Sketchs), ඇඳීම් (Drawings) සහ සිතුවම් (Painting) යන ක්‍රමවේද භාවිතයෙන් යට කී වාර්තාකරණයන් සිදු විය. බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ දී මෙම දෘශ්‍ය වාර්තාකරණයන් වඩාත් විශ්වාසනීයත්වයෙන් යුතුව ග්‍රහණය කර ගැනීමට හැකි වන පරිදි ඡායාරූපයේ ආගමනය සිදු විය.

ලක්දිව ඡායාරූප ශිල්ප ඉතිහාසයට අදාළ පළමු දත්තය හමුවන්නේ ක්‍රි.ව. 1843 දී පළමුවරට බ්‍රිතාන්‍ය ජාතික වතු පාලකයෙකු තම පෞද්ගලික අවශ්‍යතාවය පරිදි පෙට්ටි කැමරාවක් මෙරටට ගෙන ඒමත් සමඟ ය (ගුණසේකර 2012: 170). ක්‍රි.ව. 1844 වන විට කොළඹ කොටුව බේලි වීදියේ ආරම්භ කරන ලද මෙරට පළමුවන චිත්‍රාගාරය පිළිබඳව සාක්ෂි පවතී (ගුණසේකර 2014: 170). එයින් වර්ෂ කිහිපයකට පසුව මෙරට ජීවත් වූ උසස් පාන්තික නිලධාරීන් අත කැමරාව ප්‍රචලිත වන්නට විය. වතු පාලකවරු, සිවිල් නිලධාරීන්, වෛද්‍යවරුන් ඒ අතරින් ප්‍රමුඛ ය. මුල් කාලීනව වෘත්තීයමය කැමරා ශිල්පීන් යටත්විජිත ඡායාරූපකරණ ක්ෂේත්‍රය තුළ හඳුනාගත නො හැකි වූ අතර යට කී වෘත්තිකයන් අතින් ඡායාරූප නිර්මාණ කාර්යය සිදු විය. කොළඹ කේන්ද්‍රීයව බිහි වූ චිත්‍රාගාර පහසුකම් එයින් පරිබාහිරව යාපනය, මහනුවර, නුවර එළිය, ගාල්ල ආදී ප්‍රදේශ තුළට ද ක්‍රමයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව, යටත්විජිත ශ්‍රී ලංකාව තුළ වෘත්තීමය

ඡායාරූප ශිල්පීන්ගේ ස්ථාවරත්වයත්, චිත්‍රාගාර ව්‍යාපාරයේ ක්‍රමානුකූල සංවර්ධනයත් සිදු විය. මෙම ශිල්පීන්ගේ ප්‍රධාන තේමා බවට පත්වූයේ යටත්විජිත ජන සමාජය, ස්වදේශික භූමිය, පුරාවිද්‍යාත්මක ස්මාරක, අලි ඇතුන් දඩයම් කිරීමේ අවස්ථා, ස්වදේශික වැසියන් සහිත විවිධ අභිචාර විධීන් ආශ්‍රිත සිදුවීම් ය. ඒ අතර ස්වදේශික මානවයා අරමුණු කරගත් ඡායාරූප නිර්මාණය සුවිශේෂී වේ. 'අනෙකා' නිරූපිත මුල්ම ඡායාරූප නිර්මාණ කාර්යය 19වැනි සියවස දෙවන භාගයේ දී මානව විද්‍යාඥයින්ගේ ප්‍රමුඛත්වයෙන් සිදු විය (Bruce 2010: 3). අනෙකාගේ පෞද්ගලික නිරුවත නාභිගත කිරීමේ මූලික අරමුණ වූයේ ඔවුන් යුරෝපීයාගෙන් වෙනස් බව ඉස්මතු කර පෙන්වීමයි. මෙම ඡායාරූප නිර්මාණ කාර්යයේ දී අනෙකාගේ යටත්වැසිභාවය හා පහත් බව අවධාරණයට ලක් කෙරිනි (Bruce 2010: 3). ක්‍රි.ව. 1869 දී ටී. ඩබ්ලිව්. හොක්ස්ලිගේ ඉල්ලීමකට අනුව යටත්විජිත රාජ්‍ය පාලකයන් තම පාලන ප්‍රදේශය තුළ සිටින ස්වදේශිකයන්ගේ නිරුවත් ඡායාරූප ලිපිගොනු සකසා තිබේ (Levine 2008: 189). මේ අනුව පැහැදිලිවන කරුණක් නම්, යටත්විජිත යුගයේ නිර්මිත ඡායාරූප හුදු ඓතිහාසික අහම්බයක් නොවන බවයි. අධිරාජ්‍යයේ ඉල්ලීම පරිදි යටත්විජිත ස්වදේශිකයන්ගේ ඡායාරූප ලබා ගැනීමේ ඇරඹුමෙන් පසු කලාගාර පහසුකම් නිර්මාණය කරන ලදි (Gardon 2007: 10). බ්‍රිතාන්‍ය යටත්විජිත බවට පත් වූ සෑම රටකම පාහේ ඡායාරූප නිර්මාණකරණය සිදු වූ බව මේ අනුව පැහැදිලි ය. ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමරිකානු හා ඕස්ට්‍රලේශියානු කලාපවල සියවස් පහකට අධික කාලයක් මුළුල්ලේ මුදා හරිනු ලැබූ මෙම අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස මෙම යටත්විජිත ඡායාරූප නිර්මාණය විය.

යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය හා යටත්විජිත වැසියා

යටත්විජිතවාදී කතිකාව තුළ යටත්විජිත කාරකයා විසින් යටත්වැසියන් තේරුම්ගත් සහ ඔවුන්ව විග්‍රහ කළ ආකාරය පිළිබඳව මෙහි දී විමසා බැලේ. යටත්විජිතවාදීන් වෙනුවෙන් මුල් කාලීනව යටත්විජිත වැසියන් පිළිබඳව විස්තර විග්‍රහ ඉදිරිපත් කිරීමේ කාර්යභාරය ඉටුකරන ලද්දේ මෙම රටවල් තුළ සංචාරය කළ මිශනාරීන්, වෙළෙන්ඳන්, මුහුදු කොල්ලකරුවන්, හමුදා නිලධාරීන් වැනි අය විසින් සටහන් කරන ලද, උත්කර්ෂයට නංවන ලද දින සටහන් සහ අනෙකුත් සංචාරක වාර්තා මඟිනි (පතිරගේ 2005: 84). ඉන් පසුව මෙම කාර්යභාරය යටත් ප්‍රදේශ පාලනය කිරීමට පැමිණි සිවිල් නිලධාරීන් සහ අනෙකුත් විජිතවාදී බුද්ධිමතුන් අතින් සිදු විය. මෙම කුමන පාර්ශවයක් පිළිබඳව සලකා බැලුව ද ඔවුන් මෙම යටත් වැසියන් දෙස බලන ලද්දේ පටු, ආන්තිකවාදී දෘෂ්ටි කෝණයකිනි (පතිරගේ 2005: 84). එම දෘෂ්ටි කෝණය 'යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය'

වශයෙන් හැඳින්වේ. එනම්, යුරෝපීය ආකල්ප හා සංස්කෘතික දෘෂ්ටි මුල් කොට ගනිමින් ලෝකයේ අනෙක් කලාප දෙස බැලීම සහ ඒවා ඇඟ යුම් කිරීමේ පිළිවෙතයි (පතිරගේ 2005: 114). එම දෘෂ්ටිකෝණයට අනුව යුරෝපීයයා ශිෂ්ටසම්පන්න, බුද්ධිමත්, තාර්කික, දියුණු, ඉදිරිගාමී දැක්මක් සහිත පුද්ගලයන් ලෙස අර්ථවත් කෙරෙන අතර යටත්වැසියාව දුටුවේ ඊට ප්‍රතිපක්ෂවය. එනම්, අශිෂ්ට, ම්ලේච්ඡ, වනචාරී, හැඟීම්බර, නොදියුණු, පසුගාමී ජන කණ්ඩායමක් වශයෙනි. ඒ අනුව, මෙම දෘෂ්ටිවාදය මඟින් තහවුරු කරන ලද්දේ තම විජිතවාදී ආකල්පය සාධාරණීකරණය කිරීමේ අවශ්‍යතාවයයි (පතිරගේ 2005: 84). එනම්, මෙම ප්‍රජාව ශිෂ්ට සම්පන්න, බුද්ධිමත්, තාර්කික ප්‍රජාවක් කිරීමේ හැකියාව ඇත්තේ තමන්ට බව පැවසීමට ය. මෙම පටු වර්ගවාදී දෘෂ්ටිය මඟින් යටත්විජිත හාම්පුතුන්ගේ විශිෂ්ටත්වයත් යටත්වැසියාගේ පහත් බවත් තහවුරු කරන ලදි.

> සිංහලයා ස්වාභාවයෙන්ම කම්මැලි ජාතියකි. යන්තම් ඔහේ උපන්නාට වැනෙනවා විනා වැඩ කිරීමට නම් ඔවුහු එතරම් රුචියක් නො දක්වති. ඔවුහු විලි වසාගන්නට වස්ත්‍රත්, කන්නට බොන්නට ආහාර-පානත් අඳුරේ සිටින්නට බැරි නිසා පහන් දල්වා ගන්නට තෙලුත් සපයා ගනිති. ඒ ඔවුන් හට හොඳටම ප්‍රමාණවත් ය (නොක්ස් 1998: 122).

රොබට් නොක්ස්ගේ එදා හෙළදිව කෘතියෙන් උපුටාගත් පූර්වෝක්ත උදෘතයෙන් විස්තර කෙරෙනුයේ තත්කාලීන සිංහලයාගේ ජීවන ස්වාභාවයයි. නොක්ස්ට අනුව සිංහලයා යනු කම්මැලි, පසුගාමී සත්ත්ව කොට්ඨාශයකි. සිංහලයින් දෛනික පැවැත්මට අත්‍යවශ මූලික කරුණු ඉටු කර ගැනීමට පමණක් උත්සාහ දරණ බව වැඩි දුරටත් ඔහු අවධාරණයට ලක් කරයි.

> සාමාන්‍ය මිනිසුන්ගේ අදහස් ගතවන පැයක කාලය තුළ සිදුවන සිදුවීම්වලින් ඔබ්බට යන බවක් නො පෙනේ. එමෙන්ම ඔවුහු අතීතය පිළිබඳව නො සිතනවාක් මෙන්ම අනාගතය පිළිබඳව ද අපරීක්ෂාකාරී වෙත්. ඔවුන්ගේ ජීවිත පහසු කම්මැලි ස්වාභාවයකින් ගෙවී යන අතර, හුදු සත්ත්ව ලෝකයට වඩා ඉහළ මට්ටමකින් පවතින්නේ මඳ වශයෙනි (ජේම්ස් කෝර්ඩිනර්- උපුටා ගැනීම පතිරගේ 2005: 85).

> ජීවිතය මුළුල්ලේම මන්දගාමී ලෙස බඩගාගෙන යන පණුවාගේ එකම අභිප්‍රාය වන්නේ උගේ ආහාර පරිභෝජනය කිරීම සඳහා පැගී මියයාමෙන් වැළකී සිටීමයි. එම පණුවා කෙට්ටු කම්මැළි සහ ක්‍රියාශීලීත්වයෙන් තොර ලාංකිකයා තරම්ම උතුම් වූවෙකි. ඔහුගේ සහචරයන් වන අලියා ගම් ඌරා යන සත්තු ඔවුන්ට වඩා බෙහෙවින් ඉදිරිගාමී වෙත් (එඩ්වර්ඩ් සලිවන්ස්- උපුටා ගැනීම පතිරගේ 2005: 86).

කෝඩිනර් සහ සලිවන්ස්ගේ පූර්වෝක්ත උදෘත මඟින් ස්වදේශිකයන්ගේ චර්යාවන් හාස්‍යයට නංවා තිබේ. ශ්‍රී ලාංකිකයින්ගේ ශරීර ස්වභාවය කෙට්ටු පණුවෙකුට සමාන කර දක්වන සලිවන්ස් ස්වදේශිකයාගේ ක්‍රියාශීලීත්වයෙන් තොර බව 'උතුම්' යන පදය භාවිතයෙන් හාස්‍යයට නංවා තිබේ. ඔවුන්ට අනුව මනුෂ්‍ය ජීවිතය අතිශය කාර්ය බහුල විය යුතු ය. අනාගතය පිළිබඳව උපකල්පනය කොට ආරක්ෂණය උදෙසා බව භෝග රැස් කළ යුතු ය. මෙම දෘෂ්ටිය 18 හා 19 වන ශතවර්ෂවල යුරෝපය පුරා මතු වූ පුනරුදවාදී මතවාදයේ එක් සෙවණැල්ලකි (පතිරගේ 2005ඃ 85). කෝඩිනර් වැන්නවුන් වටහා නො ගත් යථාර්තය නම්, කිසියම් ප්‍රජාවකගේ ලෝක දෘෂ්ටිය පූර්වයේ සඳහන් කළ පරිදි එම ප්‍රජාවගේ ආර්ථික, ආගමික හා සාමාජීය පැවැත්ම සමඟ බද්දව පවතින්නක් බවයි (පතිරගේ 2005ඃ 85). මේ අනුව පැහැදිලිවන ප්‍රධානතම කරුණක් නම් සෑමවිටකම යටත්විජිත කාරකයා ස්වකීය සංස්කෘතික මිනුම් දඬු ඇසුරින් 'අනෙකා' සාධනය කර ඇති බවත් එමඟින් අනෙකා සමාජ ආන්තීකරණයට ලක්කර ඇති බවත් ය. විජිතවාදීන්ගේ මෙම මතවාදීමය පසුබිම යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය වශයෙන් හඳුනාගත හැකි ය. යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය අනුව යටත්විජිත වශයෙන් පවතින නො දියුණු රටවල් ප්‍රගමනය සඳහා තල්ලු කළ යුතුය. යටත්විජිත බවට පත් වූ රටවල් වෙත පැමිණි හාම්පුතුන් හා මිෂනාරීන් සිදු කළ ප්‍රකාශයක්වන "අප පැමිණියේ නුඹලා ශිෂ්ට කිරීමටයි" යන්නෙන් අර්ථවත් වන්නේ එයයි. යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් වූ මිෂනාරි අධ්‍යාපනය, බාලදක්ෂ ව්‍යාපාර ප්‍රචලිත කරවීම, 'අනෙකා' ශිෂ්ට කිරීමේ යුරෝපීය උත්සාහයන්ගේ ප්‍රතිඵල වශයෙන් පෙන්වාදිය හැකි ය.

යටත්විජිතවාදින් විසින් ගොඩනංවනු ලැබූ මෙම කතිකාව විශ්ලේෂණය කිරීම සඳහා එඩ්වඩ් සයීඩ් විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රාචීනවාදය (Orientalism) නැමති සංකල්පීය ප්‍රවේශය මෙම සාකච්ඡාවෙහි ලා සුවිශේෂී වේ. බටහිර කලාපය තුළ සම්පාදනය වී බෙදා හැරෙන ප්‍රාචීනවාදය පිළිබඳ සංකල්පය විසින් හැමවිටම ඉටු වූයේ පළමුවන ලෝකය දිදුලන මාධ්‍යය හැටියටත් අනෙකුත් හැමෙකක්ම එහි පරිවාරය හැටියටත් ප්‍රක්ෂේපණය කිරීමකි (පෙරේරා 1993ඃ 28). ප්‍රාචීනවාදය යනු, 'බටහිර වැසියා' පෙරදිග පිළිබඳව ඥාණනය කරනු ලැබූ පිළිවෙළකි. එනම් පෙරදිග වැසියාගේ ජීවන ශෛලී, ලෝක දෘෂ්ටි සහ ලෝක සම්මත පිළිබඳව කරනු ලැබූ ලේඛනගත කිරීමක් ලෙස හැඳින්විය හැකි ය. වඩාත් වැදගත් දෙය නම් මෙම ලේඛනගත කිරීම අතිශයින් මානවවංශ කේන්ද්‍රීය විමයි. එනම් බටහිර දෘෂ්ටි කෝණයට අනුව පෙරදිග වැසියා මාන ගත කිරිමයි (පතිරගේ 2005ඃ 95). ප්‍රාචීනවාදී සංකල්පය හරහා යුරෝපීය දැනුම් පද්ධති මඟින් 'අනෙකා' ගොඩනැංවීමත් ඒ මඟින් පෙරදිග වැසියා මත හෙළන තම බලය සුජාත කිරීමේ යුරෝ-කේන්ද්‍රීය උත්සාහයත් නිරීක්ෂණය කළ හැකි ය. ඒ අනුව, බටහිර ප්‍රාචීනත්වය පිළිබඳ කතිකාව තුළ පෙරදිග

වැසියා අශිෂ්ට, ම්ලේච්ඡ, නො දියුණු, පසුගාමී ආදී සියලු දුර්ගුණයන්ගෙන් යුක්ත පුද්ගලයෙක්වන අතර ඔවුන්ව ශිෂ්ට සම්පන්න කිරීමේ, දියුණු කිරීමේ ක්‍රියාවලිය සඳහා දේව බලය ඇත්තේ බටහිරයාට බව අවධාරණය කෙරේ. බටහිර කලාප තුළ සම්පාදනය වී ව්‍යාප්ත වූ මෙම ප්‍රාචීනවාදය නැමති සංකල්පය විසින් සෑම විටකම ඉටු වූයේ පළමුවන ලෝකය දිදුලන මාධ්‍ය ලෙසත් අනෙකුත් ප්‍රදේශ එහි පරිවාරය ලෙසටත් ප්‍රක්ෂේපණය කිරීමයි (පෙරේරා 1993: 28).

යටත්විජිත සුදු ශරීරයට සාපේක්ෂව 'අනෙකා' නිරූපණය

අනෙකා (The Other) යනු, විජිතවාදීන් විසින් යටත්විජිත වැසියා හැඳින්වීම සඳහා භාවිතා කරනු ලබන විශේෂණ පදයකි. 'යටත්' යන්නෙන් අවනත වූ, කීකරු වූ, සුවච වූ සහ යමෙකුගේ බලය පිළිගත්තා වූ යන අදහස් ගම්‍ය වන අතර 'යටත් වැසියා' යන්නෙන් කිසියම් රාජ්‍යයකට අවනතභාවය ප්‍රකාශ කළ, යටත්ව ජීවත්වන්නා යන අදහස මුක්ත වේ. මෙම අනෙකා ගොඩනැඟීම තුළ ඇත්තේ ද්විත්ව ප්‍රතිපක්ෂය (Binary Opposition) පිළිබඳ අදහසකි (පතිරගේ 2005: 86- 87). ද්විත්ව ප්‍රතිපක්ෂය යනු, ලෝකය දෙකට කඩා විග්‍රහ කිරීමේ පිළිවෙතයි. නිදසුන් ලෙස කළු-සුදු, හොඳ-නරක, විදග්ධ-මුග්ධ, ස්ත්‍රී-පුරුෂ, උස්-පහත් ආදී වශයෙනි. මෙම විග්‍රහය තුළ අත්තුක්කංසනවාදී සහ පරවම්භනවාදී පිළිවෙතක් අන්තර්ගත වේ (පතිරගේ 2005: 87). එනම්, සෑම තැනකදීම 'මා' ශ්‍රේෂ්ඨවන අතර, 'අනෙකා' තමාට වඩා පහත් තැනක ස්ථානගත කිරීමයි. මෙය ධ්‍රැවීලිගත කිරීමකි. මෙම අර්ථකතනයට අනුව විමසා බැලීමේ දී යුරෝපීයා තම ස්ථානය කේන්ද්‍රය ලෙසත්, යුරෝපයට පරිබාහිර අනෙකුත් සමාජ පරිවාරය ලෙසත් සිතියම්ගත කරයි. මෙම කේන්ද්‍රය හා පරිවාරය අතර වෙනස පදනම් වන්නේ ඔවුන්ගේ ශිෂ්ටත්වය පිළිබඳ විග්‍රහය මතයි. ඒ අනුව සැලකීමේ දී කේන්ද්‍රය ශිෂ්ට වන අතර පරිවාරය අශිෂ්ට වේ (පතිරගේ 2005: 87). එනම්, යටත්විජිත කාරකයා ශිෂ්ට වන අතර යටත්වැසියා අශිෂ්ට වේ. කේන්ද්‍රය බුද්ධිමත් හා තාර්කික වන අතර, පරිවාරය, මුග්ධ හා හැඟීම් බර වේ. මෙහි දී යුරෝපීයා නිරන්තරයෙන්ම විශිෂ්ටත්වයට පත්වන අතර පරිවාරය විශිෂ්ටත්වය යදින්නෝ වෙති (පතිරගේ 2005: 87). යටත්විජිතවාදීන් විසින් පරිවාරය සූරාකෑම පිණිස තමන්ට ඇති අයිතිය සුජාතභාවයට පත් කරනු ලැබුවේ මෙම ද්විත්ව ප්‍රතිපක්ෂය මත පදනම් වෙමිනි. මෙම මතයට අනුව පරිවාරයේ සිටින අශිෂ්ටයන් ශිෂ්ට කළ හැක්කේ කේන්ද්‍රයට පමණි. මේ අනුව, කේන්ද්‍රය අනිවාර්යයෙන්ම උසස් බවට පැමිණේ. මෙම මතවාදය හරහා අනෙකා වහල් භාවයට පමුණුවන අතර ශ්‍රම සූරා කෑම හා එම රටවල සම්පත් කොල්ලකෑම සිදු කරන ලදි. එබැවින් මෙය අතිශය ම්ලේච්ඡ පිළිවෙතක් ලෙස හඳුනාගත හැකිය.

මෙකී සන්ධර්භයන් සුජාත භාවයට පත් කිරීමේ මතවාදීමය ප්‍රවිශ්ටය යටත්විජිතවාදය වශයෙන් හැඳින්වේ. ඒ අනුව සැලකීමේ දී 'අනෙකා' යනු යටත්විජිතවාදී මතවාදයේ ප්‍රතිඵලයකි. ස්වදේශිකයා නිරූපිත ඡායාරූප වනාහී එහි නිර්මිතයන් වශයෙන් හඳුනාගත හැකිය.

යටත්විජිත කාරකයාගේ සේවයට කැපවී සිටින ස්වදේශිකයන් දැක්වෙන ඡායාරූප නියැඳියක් ආශ්‍රයෙන් අනෙකා අරමුණු කරගත් යටත්විජිතවාදී මතවාදය අධ්‍යයනය කළ හැකිය. ඒ අනුව දේශීය ප්‍රවාහන මාදිලීන්, දඬයම් දර්ශන සහ කම්කරුවන් ආශ්‍රිත ක්‍රියාකාරකම් දැක්වෙන අවස්ථාවන් කිහිපයක් වෙත අවධානය යොමු කරන ලදි. මෙහි දී යටත්විජිත කාරකයාගේ බලය විද්‍යමාන කිරීම උදෙසා ස්වදේශික දේහයේ පිහිටුවීම සිදු කරන ලද්දේ කෙසේ ද? යන්න විමසා බැලීම වැදගත් වේ. ශ්‍රී ලාංකේය යටත්විජිත යුගයේ දී ඉතා සුලභව භාවිතා වූ ප්‍රවාහන මාදිලීන් වශයෙන් දෝලා, රික්ෂෝ, තිරික්කල්, බක්කි කරත්ත හා ගැල් කරත්ත හඳුනාගත හැකිය (රූපය 1, රූපය 2). තිරික්කල් හා ගැල් කරත්ත හැරුණු විට ඉහත සඳහන් සියළුම ප්‍රවාහන මාධ්‍යයන් හැසිරවීම සඳහා මිනිස් ශ්‍රමය අනිවාර්ය සාධකයකි. පූර්වෝක්ත ඡායාරූප නියැඳිය අධ්‍යයනයේ දී පර්යේෂකයා විසින් හඳුනාගත් පොදු කරුණක් වන්නේ යට කී ප්‍රවාහන මාධ්‍ය හැසිරවීමට අවැසි ශ්‍රමය සපයන්නාගේ භූමිකාව ස්වදේශිකයා සතු වීමත් අදාළ රථයේ නැගී ගමන් ගනිමින් සිටින්නාගේ භූමිකාව විදේශිකයා සතු වීමත් ය.

රූපය 1 - Catamarans on Shore, Date Unknown, Skeen & Co.

ප්‍රභූ චරිතය ස්වදේශිකයන්ගේ කර මතින් ගමන් ගැනීම හරහා ස්වදේශිකයන් යටත්විජිත කාරකයන්ගේ සේවයට කැපවී සිටින බව සංකේතවත් කිරීම

රූපය 1 හි දැක්වෙන්නේ දෝලාවකින් රැගෙන යන විදේශික ප්‍රභූ ස්ත්‍රියකි. ඡායාරූපයේ ප්‍රධානතම දෘශ්‍ය අරමුණ වනුයේ දෝලාවේ නැගි ස්ත්‍රිය යි. ද්විතීක දෘශ්‍ය අරමුණු වශයෙන් පිළිවෙළින් ඇය නැගී සිටින දෝලාව සහ එය දරා සිටින ස්වදේශිකයන් හඳුනාගත හැකි ය. ස්ත්‍රී ශරීරය ප්‍රමුඛත්වයට පත් වනුයේ ඇය ඡායාරූප රාමුවේ මධ්‍යයේ ස්ථානගත වූ බැවිනි. ස්වදේශිකයන් දරා සිටින දෝලාවේ තිරස් ආධාරකය හේතුවෙන් ස්ත්‍රී චරිතය ස්ථානගත වූ අවකාශය නරඹන්නාගේ සෘජු අවධානයට ලක් වේ. ස්ත්‍රිය පාර්ශවදර්ශීව නිරූපණය වේ. උඩු කය සිරුරේ සෘජු බව, ඇඳුම් විලාසිතා සහ ශරීර වර්ණ යන කරුණු හේතුවෙන් ඇගේ අභිනය තුළින් ප්‍රභූ භාවයන් නිරීක්ෂණය වේ. ප්‍රභූන් යනු, සමාජයේ මතවාදීමය ආධිපත්‍ය හිමි පිරිසකි. පතිරගේට අනුව ප්‍රභූන් යනු, තම හඬ අන් අයට ශ්‍රවනය කරවීමට හැකි පුද්ගලයා ය; මෙම හඬ සමාජයේ අනු ස්ථර විසින් බලායනිත සහ පිළිගැනීමක් ලැබුණු හඬක් වේ (2005: 90). එනම්, යම් සමාජ සන්ධර්භයක් තුළ පුද්ගලයෙකුට තමාව නියෝජනය කිරීමට ඇති හැකියාවත්, එම නියෝජනය කිරීම හරහා තමාගේ මෙන්ම අනෙකාගේ පැවැත්ම ද තහවුරු කිරීමට තමාට හැකි ශක්‍යතාවත් ප්‍රභූවරයෙක් සතු සුවිශේෂී ශක්‍යතා වේ. ඒ අනුව සමාජය තුළ තමාව නියෝජනය කිරීමට අවකාශයක් නොමැති, එසේ අවස්ථාවක් ලැබුණ ද තම හඬ බලායනයෙහි හැකියාවක් නොමැති පුද්ගලයා නිර්-ප්‍රභූන් වශයෙන් හැඳින් වේ (පතිරගේ 2005: 90-91). එබැවින් දෝලාව මත සුව පහසුව අසුන් ගත් මෙම ස්ත්‍රී අභිනය ප්‍රභූත්වයේ සූචකයකි. දෝලාව දරා සිටින ස්වදේශික පුරුෂයින් ද පාර්ශවදර්ශීව නිරූපණය කෙරුණ ද ඔවුන්ගේ ශාරීරික පිහිටීමේ ත්‍රිබංග ලීලාව සහ හිසෙහි පිහිටීම හේතුවෙන් ස්ත්‍රී ස්වභාවයන් තිව්‍ර කෙරේ. එම අභිනයන් දෝලාවේ බර දරා සිටීමේ වෙහෙස පිළිබඳ නිරූපිතයන් වශයෙන් හඳුනාගත හැකි ය. ඔවුන්ගේ ඇඳුම් විලාසිතාවන්හි විකෘති ස්වරූපය, අපිළිවෙළ බව සහ ශරීර වර්ණයේ අඳුරු බව මඟින් ස්වදේශිකයාගේ අශිෂ්ටත්වය ඉස්මතු කරවන අතර එය නිර්ප්‍රභූත්වයේ සංකේතයකි. එමඟින් ස්ත්‍රියගේ ප්‍රභූ භාවය තවදුරටත් තහවුරු කෙරේ. ඉදිරියේ සිටින ස්වදේශික පුරුෂයා යට කී සමාජ ස්ථර දෙක අතර මැදි පුද්ගලයෙකි. රාජකාරීමය වශයෙන් බටහිර ජාතිකයින්ට ගැතිකම් කළ දේශිය අතරමැදි පැලැන්තියක් මෙවකට බිහිවී තිබිණි. 'බුර්ෂුවා' වශයෙන් හඳුන්වනු ලැබූ ඔවුන්ගේ බාහිර පෙනුම, චර්යා හා ආකල්ප මෙරට සමාජයට යම් ආගන්තුක භාවයක් පෙන්නුම් කරන ලදි. ස්වදේශීය හා විදේශීය දෙමුහුම්කරණයෙන් නිර්මිත ඇඳුම් විලාසිතාවකින් සැරසී සිටින ඔහු කැමරාවට සෘජුව මුහුණ ලා සිටියි. ඔහුගේ ඇඳුම් විලාසිතාව පිළිබඳව සැලකීමේ දී සෙසු ස්වදේශිකයන්ට සාපේක්ෂව උසස් භාවයක් විශද කළ ද ස්ත්‍රියගේ ප්‍රභූත්වයට අභියෝග කිරීමේ හැකියාවක් නොමැති අතර ඔහුගේ අභිනය මඟින් විදේශික ගැතිභාවයන් ප්‍රදර්ෂණය කෙරේ.

රූපය 2 - Rickshaws, Date Unknown, Scowen & Co.
ස්වදේශිකයන් වෙත හිමිව ඇති භූමිකාව මඟින් යටත්විජිතකාරකයන්ගේ සේවයට කැපවී සිටින බව සංකේතවත් කිරීම

රූපය 2 හි දැක්වෙන්නේ සාමූහික රික්ෂෝ කිහිපයකි. මෙහි ද ස්වදේශිකයා රථය පදවන්නාගේ භූමිකාව නියෝජනය කරන අතර එහි නැඟී ගමන් කරමින් සිටිනුයේ යටත්විජිතකාරක පක්ෂයයි. විදේශිකයන් රථයට නැඟී අසුන්ගෙන සිටීමේ විවිධ අභිනයන් මඟින් ප්‍රභූත්වය තීව්‍ර කෙරේ. ඔවුන් නැඟී සිටින රථය පදවන ස්වදේශිකයින්ගේ අභිනයන් මඟින් යටහත්-පහත් බව හා විදේශිකයාගේ සේවයට කැපවී සිටින්නේය යන අදහස සූචනය කෙරේ. එය නිදර්ශිත සෑම ඡායාරූපයකටම පොදු වූ ලක්ෂණයකි. 'රථය පදවන්නා' යන අදහස මොටර් රථයකට ආදේශ කළහොත්, එම භූමිකාව නියෝජනය කරන්නා බලය සහිත පුද්ගලයා වශයෙන් හඳුනාගත හැකි ය. මන්දයත් මෝටර් රථය හැසිරවීමේ පූර්ණ බලය හිමිවන්නේ එය පදවන්නාට වන බැවිනි. නමුත් ඉහත ඡායාරූපවල රථය පදවන්නා වශයෙන් හඳුනාගත් භූමිකාව නියෝජනය කරන්නා එම රථය හැසිරවීමේ පූර්ණ බලය හිමි තැනැත්තා නොවේ. ඔහු එම රථය චලනය වීමට හෝ ඉදිරියට ඇදගෙන යාමට අවැසි ශ්‍රමය ලබා දෙන්නා පමණි. එම රථය පාලනය වන්නේ එහි නැඟී සිටින විදේශිකයාගේ අවශ්‍යතාවයන්ට අනුරූපීව ය. ශරීර ඉරියව් නිරූපණය, ශරීර ස්ථානගතවීමේ අවකාශය, ඇඳුම් පැළඳුම්හි ස්වරූපය, ශරීර වර්ණය යනාදී සියලුම කරුණු

පිළිබඳව සලකා බැලීමේ දී ප්‍රමුඛත්වයට පත්වනුයේ යටත්විජිත කාරකයා මිස ස්වදේශිකයන් නොවේ. මෙහි සිටින ස්වදේශිකයින් සියලුදෙනාගේ උඩුකය නිරුවත්ය. එම ස්වදේශිකයන් පෙර බිමෙහි ස්ථානගත වෙමින් ඉදිරි පෙළ නියෝජනය කළ ද පිටුපසින් සිටින විදේශිකයින් ප්‍රමුඛත්වයට පත් වනුයේ ඔවුහු ඇඳි වස්ත්‍රයන්ගේ දීප්තිමත් සුදු පැහැති වර්ණය හේතුවෙනි. ඊට සාපේක්ෂව ස්වදේශිකයාගේ අඳුරු පැහැ නිරුවත් උඩුකය අනෙකා ගොඩනැඟීම පිළිබඳව ද්විත්ව ප්‍රතිපක්ෂය පිළිබඳ යටත්විජිතවාදී මතවාදය තහවුරු කරවීමේ කේතයකි. රික්සෝ ආසනයේ ඇඳි මත දෑත් පිහිටවුන ලද ස්වරූපය හා ඍජු, අහංකාර, උඩඟු සහගත බැල්ම මඟින් යටත්විජිතකාරක පක්ෂය සතු බලය පිළිබඳව ඇඟවුම් තීව්‍ර කෙරේ. ඊට සාපේක්ෂව ස්වදේශිකයාගේ ශරීර ඉරියව් මඟින් වෙහෙස පිළිබඳ හැඟීම් අවධාරණය වේ. රූපයේ දක්වෙන සියලුම චරිත මඟින් නියෝජනය වන්නේ පුරුෂයන් ය. නමුත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයා කෙරෙන් අපේක්ෂිත ප්‍රබලත්වය, ජවය, ශක්තිය, අධිපති භාවය යනාදී කරුණු විශද වන්නේ රික්ෂෝවේ නැගී අසුන්ගත් විදේශිකයන් වෙතින් පමණි. ස්වදේශික පුරුෂයන් කෙරෙන් නිරීක්ෂණය වනුයේ ස්ත්‍රීත්වය පිළිඹිබු කරවන ලක්ෂණ පමණි. එනම්, යටහත්-පහත්, දුර්වල, බෙලහීන භාවයන් පමණි. ඡායාරූපයේ වම් හා දකුණු කෙළවර සිටින ස්වදේශික පුරුෂයන්ගේ ත්‍රිබංග ඉරියව් මඟින් ඉස්මතු වූ ශරීරයේ 'S' හැඩති ආකෘතිය මඟින් ස්ත්‍රී ස්වභාවය අවධාරණය කෙරේ. යටත්විජිත කතිකාවේ දකුණු ආසියානු පුරුෂ ශරීරය වනාහී උත්සාහයෙන් හා උනන්දුවෙන් තොර විඩාවට පත් ස්වරූපයෙන් ගොඩ නැංවී ඇති දෙයකි (ශනාතනන් 2008: 80). එම යුරෝ කේන්ද්‍රීය මතවාදයෙහි ලා සැලකීමේ දී විඩාපත්ව සිටින පුරුෂයන්ගේ ආංගික අභිනය නිරූපණයන් මඟින් සූචනය කෙරෙනුයේ ස්ත්‍රීත්වයකි. 'S' හැඩති ශාරීරික පිහිටුවීමේ ස්වරූපය මඟින් යට කී ස්ත්‍රී භාවයන් තීව්‍ර වේ.

බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ දී මෙරට භාවිතා කරන ලද භාණ්ඩ ප්‍රවාහන මාදිලියක් වූ ගැල් කරත්තයක් ආශ්‍රිත දර්ශනයක් අංක 3 ඡායාරූපයේ දැක්වේ. මෙහි මානව රූප හයකි. ඒ අතර ස්වදේශිකයින් පස්දෙනෙක් සහ එක් විදේශිකයෙක් වේ. යටත්විජිත කාරක පක්ෂය නියෝජනය කරනු ලබන මෙම විදේශික චරිතය ඡායාරූපය තුළ වඩාත් ඉදිරිගාමී පාර්ශවයේ නිරූපණයකි. ඔහු සෙසු ස්වදේශික චරිතවලට සාපේක්ෂව පෙරබිමෙහි සිටියි. සැහැල්ලු ඉරියව් නිරූපණයකින් සිටින එම විදේශිකයා ඉදිරියෙහිවන ට්‍රංකා පෙට්ටියක් මත එක් පාදයක් තබා, අනෙක් පාදයට ශරීර බර යොමු කොට සිටගෙන සිටි යි. ඔහුගේ වමත ඉනෙහි රුවා සිටින අතර දකුණතේ කෙවිටකි. මෙම සමස්ථ අභිනය මඟින් අවධාරණය වී පෙනෙනුයේ බලය පිළිබඳව සංඥාවන් ය. ඉන්දියානු මහරාජා ආලේඛ්‍ය සිතුවම්හි දක්වෙන අභිනය පිහිටුවීමට සමාන ඔහුගේ ඉරියව් නිරූපණයන් ඔස්සේ

රූපය 3 - Near Kathali Tank with Natives, 1897, Photographer Unknown

විදේශික චරිතය ඡායාරූපයේ මධ්‍යයට නාභිගත කිරීම හා ප්‍රභූත්වය විශදවන අභිනය සංරචනයන් නිරූපණයයි එමඟින් සෙසු සුවදේශිකයන්ගෙන් විදේශික චරිතය ප්‍රමුඛත්වයට පත් වේ ඊට සාපේක්ෂව ස්වදේශිකයන් කෙරෙන් ගැති භාවය ප්‍රදර්ශනය වේ

පිළිබිඹු කෙරෙනුයේ ප්‍රභූත්වයකි. විදේශික ශරීර නිරූපණය හා සැසඳීමේ දී ස්වදේශික ශරීර කෙරෙන් ක්‍රියාශීලීත්වයෙන් තොර වූ යටහත්පහත් භාවයන් විශද කරවයි. එම ස්වදේශික ශරීර ස්ථානගතවී

ඇත්තේ ඉහත කී විදේශික චරිතයට පසුගාමීව ය. කරත්තය බැඳි ගොනුන් අසළ සිටින ස්වදේශික චරිතය සහ පසු පෙළේ සිටින ස්වදේශික චරිත මඟින් එකී යටහත්පහත් බව අවධාරණයට ලක් වේ. පිටුපසට කර බැඳි දෑත්හි පිහිටීම, කඳ මලු පිට දැරීම සහ ඔවුන්ගේ බැල්ම මඟින් යටත්වැසි අනන්‍යතාවයන් සෘජු ලෙස ප්‍රකාශයට පත් කෙරේ. ස්වදේශිකයා යුරෝපීයාගේ යටත් වැසියෙකි; නැතහොත් යුරෝපීයාගේ සුව පහසුව වෙනුවෙන් කැපවී සිටින්නෙකු යන්න එමඟින් අවධාරණය කෙරේ. විදේශිකයාට ආසන්නයෙන් සිටින ස්වදේශිකයා ද තම එක් අතක් ඉනෙහි රුවා විදේශික චරිතයට සමාන වූ අභිනයක් යටතේ සිටිය ද පහළට යොමු වූ හිසෙහි පිහිටීම සහ අනෙක් අතෙන් කරත්තයේ රෝදයට වාරු වී සිටීම හේතුවෙන් ඔහු කෙරෙන් ද සෙසු ස්වදේශික චරිතවලට පොදු වූ යටත්වැසි අනන්‍යතාවයන් විශද කරවයි. මෙම අභිනය මඟින්

වෙහෙස යන්න තීව්‍ර කෙරේ. නමුත් යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටියට අනුව, ඔහුගේ නිරූපණය හරහා යටත්විජිත වැසියා ස්වාභාවයෙන්ම අප්‍රාණික හා උදාසීන ජන කණ්ඩායමක් යන්න ඉස්මතු කෙරෙන බව හඳුනාගත හැකි යනේ. කරත්තය සහ එහි බැඳි ගවයින්ගේ කෘශ වූ කායික විකෘතිතා මඟින් උත්කර්ෂවත් කෙරෙනුයේ ස්වදේශිකයන්ගේ නො දියුණු බව හා දරිද්‍රභාවයයි. ඡායාරූපයේ පෙරබිමෙහි දැක්වෙන ට්‍රන්ක පෙට්ටි සහ කඳ මලු ආදිය ගැලට පැටවීමට හෝ ගැලෙන් බාගත් ඒවායි. ඒ කුමක් වුව ද එම ක්‍රියාව සිදු කළ පාර්ෂවය වී ඇත්තේ ස්වදේශිකයන් බව ඔවුන්ගේ ඉරියව් නිරූපණයන් මඟින් තහවුරු කෙරේ. පසු පෙළේ සිටින ස්වදේශිකයින් දෙදෙනා මඟින් එම දාස භාවය අවධාරණයට ලක් කෙරේ. ඔවුන් යටත්විජිත කාරකයාගේ සේවයට සැදී පැහැදී සිටි යි. එමෙන්ම ඔහුගේ නායකත්වය පිළිගැනීමට සූදානමෙන් පසු වේ. දෑත් පිටුපසට කර බැඳ සිටින ස්වදේශික දේහය මඟින් අදාළ ප්‍රකාශයන් තීව්‍ර කෙරේ. ඔහු ගැල හසුරුවන්නායි. නමුත් කෙවිට ඇත්තේ යුරෝපීයා සතුව ය. යටත්වැසියා පාලනය කිරීමට තමා සතු බලය පිළිබඳව එනයින් ව්‍යංගවත් කෙරේ. බලය යනු, තවත් කෙනෙකුගේ චර්යාවට බලපෑම් දැක්වීමේ හැකියාව වශයෙන් නිර්වචනය කළ හැකි ය (ආරියදාස 2004: 9). එබැවින් යට කී විදේශික අභිනය නිරූපණයන් මඟින් ස්වදේශික දේහය පාලනය කිරීමට ඔහුට ඇති හැකියාව උත්කර්ෂයට නංවා තිබේ.

මෙම ඡායාරූප සංරචන බහුතරයක් තුළ යටත්විජිත කාරකයා සහ යටත්විජිත වැසියා අතර සම්බන්ධය ගොඩ නගා ඇත්තේ ස්වාමි-සේවක පදනමේ පිහිටමිනි. එනම්, යටත්විජිත ප්‍රභූන් සඳහා සේවය සපයන පිරිසක් වශයෙන් ස්වදේශිකයන් නිරූපණය කෙරේ. මෙම අදහස වඩාත් තීව්‍ර කරවන ඡායාරූපමය තේමාවක් වශයෙන් දඩයම් දර්ශන දැක්වෙන අවස්ථා සුවිශේෂී වේ (රූපය 4). දඩයම නිරූපිත අවස්ථාවන් අතර අලි ඇතුන් ආදී සතුන් වීර වික්‍රමාන්විත අයුරින් මරා දැමීමේ දර්ශන සුලභව තේමා වී තිබෙන බව අධ්‍යයනය කළ හැකි ය. අලියා යුරෝපයේ විරල සතෙකු වූ හෙයින් එම දැවැන්තයින් යුරෝපීයන් විසින් වික්‍රමාන්විත අයුරින් මරා දැමීම බෙහෙවින් ජනප්‍රිය මාතෘකාවක් විය. රූපය 4 ඡායාරූපයට අරමුණ වී ඇත්තේ පසෙකින් මැරී වැටී සිටින දැවැන්තයා ඝාතනය කළ විදේශිකයා සහ ඔහුගේ සහායක පිරිසයි. පිරිස අතර විදේශකියන් තිදෙනෙකි. ඔවුන් අවි දරා සිටිති. ඒ අතර එක් ස්වදේශිකයෙකි. ඔහු නිරායුධය. විදේශිකයින් කෙරෙන් වීර වික්‍රමාන්විත භාවයන් නිරූපණය වේ. මෙම පිරිස මියගිය අලියාගේ ශරීරය මතට නැඟ හෝ ඊට වාරු වී සිටිනයුරු නිරීක්ෂණය කළ හැකිය. විදේශිකයන්ට සාපේක්ෂව ස්වදේශිකයන්ගේ ස්ථානගත වීම පිළිබඳව විමසා බැලීමේ දී යටත්විජිත කාරක පක්ෂයේ බලය ඉස්මතු කර පෙන්වීමේ අපේක්ෂාවන් හඳුනාගත හැකි ය. ඒ අනුව, විදේශිකයන් මියගිය දැවැන්තයාගේ ශරීරයේ උදරය, කඳ, ගාත්‍රාදිය මත වැතිරී සිටිය දී

රූපය 4 - Franz Ferdinand and Friends with one of the elephants he killed in Kalawela, Ceylon, in January 1893, Photographer Unknown

විදේශික චරිතයේ ඉරියව් නිරූපණයන් මඟින් වීරත්වය ප්‍රදර්ශනය කෙරෙන අතර ස්වදේශික චරිතයේ ඉරියව් නිරූපණයන් මෙන්ම ස්ථානගතවීම අනුව යටහත්-පහත් භාවය නිරූපණය කෙරේ

ස්වදේශිකයා එම දඩයක්කාරයාගේ පාදාන්තයේ වාඩි වී සිටියි. ඔහු අසුන්ගත් ඉරියව් තුළ වුව ද බිය, යටහත්-පහත් භාවය හා පක්ෂපාතීත්වයන් හඳුනාගත හැකි ය. ඊට සාපේක්ෂව විදේශික සිරුරේ ඉරියව් අධ්‍යයනයේ දී ඉතා නිදහස් හා වික්‍රමාන්විත අභිනයන් නිරීක්ෂණය වේ. නිදසුන් ලෙස ඡායාරූපයේ වම් කෙළවර සිටින විදේශිකයාගේ ඉරියව් නිරූපණයන් පෙන්වාදිය හැකිය. මෙම ඡායාරූපයෙහි දැක්වෙන පරිදි වඩාත් ඉදිරිගාමී, දක්ෂ පුද්ගලයා වන්නේ යටත්විජිත කාරකයා ය. ඒ නිසා යටත්විජිත වැසියා ඔහු ආදර්ශයට ගත යුතු ය යන්න මෙමඟින් අවධාරණය කෙරේ. මෙහි නිරූපිත ස්වදේශිකයා කිසිදු වික්‍රමාන්විත භූමිකාවක් රඟ නොපායි; යුරෝපීයාගේ යටහත් පහත් සේවකයෙකු ලෙස පමණක් පෙනී සිටියි. දඩයම් දර්ශන දැක්වෙන යටත්විජිත සිතුවම් නිරීක්ෂණයේ දී වීරත්වයට පත්වීමේ විජිතවාදී රුචිකත්වයන් මැනවින් හඳුනාගත හැකි වේ (රූපය 5). මෙහි විදේශීකයන් වීර වික්‍රමාන්විත ලෙස අවි දරා නුදුරෙහි සිටින තම ඉලක්කය වෙතට අරමුණ ගනිමින් සිටිනයුරු දැක්වේ. ඊට සාපේක්ෂව ස්වදේශිකයන්ගේ අභිනයන් හුදු සිටගන සිටීමකට සීමා කොට ඇත.

රූපය 5 - Stalking elephants- bilile- 6th May, Count Emanuel Andrasy (1853)
වික්‍රමාන්විත විදේශකියින් සහ ක්‍රියාශීලීත්වයෙන් තොර වූ ස්වදේශිකයින්ගේ නිරූපණය

අංක 5 ඡායාරූප තුළ දක්වෙනුයේ වැවිලි ආර්ථික බෝග ආශ්‍රිතව විවිධ වෘතීමය භූමිකාවන්හි නිරත වූ ස්වදේශිකයන් ය. මෙම ඡායාරූපය මඟින් නිරූපණය කෙරෙනුයේ තේ වතුවල උඩු වගාවක් වශයෙන් ව්‍යාප්ත කළ සිංකෝනා වගාව ආශ්‍රිතව ක්‍රියාකාරකම්හි නිරතව සිටින කම්කරුවන් පිරිසක් හා වැවිලිකරුවන් දෙදෙනෙකි. ස්වදේශිකයන් ස්වකීය වෘත්තීමය ක්‍රියාකාරකම්හි නිරතව සිටින අතර විදේශිකයින් විසින් එම කම්කරුවන් නිරීක්ෂණයට ලක්කරමින් සිටියි. ස්වදේශික චරිත හා සැසඳීමේ දී විදේශිකයන්ගේ අභිනය සංරචනයන් මඟින් ස්වකීය බලය හා අධිපති භාවය තීව්‍ර කෙරේ. 'බලය' යනු, අභිප්‍රායාත්මක හිමිකමක් (Intended Effect) හෙවත් අවශ්‍යදේ ලබා ගැනීම සඳහා ඇති හැකියාවයි (ආරියදාස 2004: 293). බලය යන්න විවරණය කිරීමේ දී මූලික අර්ථ තල දෙකක් දක්විය හැකි ය. ඉන් පළමු වැන්න කිසියම් අභිමතාර්ථයක් මුදුන්පත් කර ගැනීම සඳහා කිසියම් පුද්ගලයෙකු තුළ ඇති ශක්තියයි. දෙවැන්න කිසියම් පුද්ගලයෙකු හෝ වස්තුවක් හෝ තමාට අභිමත පරිදි පාලනය කිරීමට ඇති ශක්තියයි (දිසානායක 2010: 257). යටත්විජිත කාරකයා ස්වකීය අභිමථාර්ථ මුදුන්පත් කර ගැනීමේදී ස්වදේශිකයා මතට බලය යොදවනු ලැබුයේ මෙම දෙවැනි අරමුණ මූලික කර ගනිමිනි. මැක්ස් වෙබර් දක්වන පරිදි බලය යනුවෙන් අර්ථවත් වන්නේ සමාජයේ සෙසු අයගේ ජීවිත කෙරෙහි බලපාන තීරණ ගැනීමේ කිසියම් පුද්ගලයෙකු සතු හැකියාවයි (සිල්වා

1997: 9). වෙබර් බලය නිර්වචනය කරන ලද්දේ කෙනෙකුගේ අභිමතයට අනුව අන් අයගේ චර්යාව මෙහෙය වීමට ඇති හැකියාව යනුවෙනි. ඒ අනුව මෙහි සිටින විදේශිකයින්ගේ දෙඅත් පිටුපසට කර බැද සිටීමේ හෝ ඉනට ගෙන සිටීමේ ඉරියව් මඟින් අනෙකා පාලනය කිරීමට තමාට ඇති හැකියාව ප්‍රදර්ශනය කෙරේ. එමගින් අණදීමක් හෝ විධාන දීමක් පිළිබඳ අදහස සූචනය වේ. වෘත්තීය ක්ෂේත්‍ර වාර්තාකරණයන්ට අමතරව වතු කම්කරුවන් හා වැවිලිකරුවන් එක්ව ගත් සමූහ ඡායාරූප පිළිබඳව මෙම ප්‍රවර්ගය යටතේ වැදගත් වේ. ඉහත සාකච්ඡා කළ ඡායාරූපය තුළ ද සාමූහික පිරිස් අධ්‍යයනය කළ හැකි මුත් ඔවුහු වෘත්තීමය ක්‍රියාකාරකම් හි නිමග්නව සිටිනයුරු නිරීක්ෂණය විය (රූපය 5 හා 6 සසඳන්න).

රූපය 6 - Workers Pruning Cinchona Tree in Tea Estate, Date Unknown, W. L. H. Skeen Co.
වතු කම්කරුවන් වෘත්තීයමය ක්‍රියාතාරකම් සිදු කරමින් සිටින අතර විදේශිකයන් අධීක්ෂණය කරමින් සිටී විදේශිකයන් කෙරෙන් අණ දීම සංකේතවත්වන අතර ස්වදේශිකයන් ඔවුන්ගේ අණට කීකරු වූ ස්වරූපයන් නිරීක්ෂණය වේ

නමුත් මෙම ඡායාරූප තුළ පසුබිම් සංරචනයන් වෘත්තීයමය භූමිකාවන් හා සම්බන්ධ වුව ද ඡායාරූපයේ නිරූපිත පුද්ගලයන් අදාළ ඡායාරූපය ගනු ලැබූ අවස්ථාවේ දී ඊට පෙනීසිටීම සඳහා පෙර සූදානමක් සහිතව සිටින බව අධ්‍යයනය කළ හැකි ය (රූපය 6). ස්වදේශික වෘත්තිකයින් හා වතු වැවිලිකරුවෙක් මෙහි දී හඳුනාගනු ලැබේ. මෙහි ප්‍රධානතම දෘශ්‍ය අරමුණ වී ඇත්තේ ස්වදේශික වතු කම්කරුවන් ය. විදේශික චරිතය

ස්ථානගත කිරීමේ දී එම කම්කරුවන්ට පිටුපසින් දැක්වීම සුවිශේෂී ලක්ෂණයක් වශයෙන් හඳුනාගත හැකි ය. යටත්විජිත ඡායාරූප අධ්‍යයනය කරන ලද ලෙවින්ට අනුව, මෙවැනි ස්ථානගත වීම් මඟින් විජිතවාදීන් හා විජිතවාසීන් අතර ඇති අසමානතා ඉස්මතු කර පෙන්වීම අරමුණු කර තිබේ (2008: 198-199). ඒ අනුව, නිරුවත් බව හා වස්ත්‍ර සහිත බවේ ඇති වෙනස, දේශීයත්වය සහ යටත්වැසියන්ගේ විවිධත්වය හා උස අනුමාන වශයෙන් පැහැදිලි කිරීමේ ප්‍රයත්නයන් හඳුනාගත හැකි බව ඔහුගේ අදහසයි. E. H. මැන්ස්ගේ යුරෝපීය යටත්වැසියන් සමූහයක් සමඟ ගත් ඡායාරූපය තුළ විදේශික සිරුරේ ස්ථානගතවීම පිළිබඳව අර්ථ දක්වමින් ලෙවින් මෙම මතය ගෙනහැර දක්වයි (රූපය 7). ලෙවින්ස්ගේ අර්ථදැක්වීම හා සැසඳීමේ දී පූර්වෝක්ත නිදර්ශිත ඡායාරූපය තුළ විදේශික සිරුරේ ස්ථානගතවීම මඟින් විදේශීය බලය හා යටත්වැසියන්ගේ අවනත භාවය, ශාරීරික වෙනස්කම්, ඇඳුම් පැළඳුම්හි විවිධත්වයන් වැනි කරුණු පිළිබඳව වාර්තා කිරීමේ උත්සාහයන් නිරීක්ෂණය වේ. විදේශික සිරුරේ ස්ථානගතවීම මඟින් ස්වදේශික ශරීරයට සාපේක්ෂව විදේශික ශරීරයේ උස පරිමාණය හා ශරීර ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලැබිය හැකි වේ.

රූපය 7 - Planter-Estate Workers, Date Unknown, Photographer Unknown
විදේශික දේහය ස්වදේශිකයන්ට පිටපුසින් ස්ථානගත වුව ද උඩින් වැඩි බැවින් එම චරිතය ප්‍රමුඛත්වයට පත්ව ඇත



රූපය 8 - E.H.Man, Eropeans with a group of Onges, Little Andaman, 1880s
විදේශිකයන්ගේ ස්ථානගත වීම් මඟින් විජිතවාදීන් හා විජිතවාසීන් අතර ඇති අසමානතා ඉස්මතු කර පෙන්වීම අරමුණු කෙරේ. ඒ අනුව, නිරුවත් බව හා වස්ත්‍ර සහිත බවේ ඇති වෙනස, දේශීයත්වය සහ යටත්වැසියන්ගේ විවිධත්වය හා උස අනුමාන වශයෙන් පැහැදිලි කිරීමේ ප්‍රයත්නයන් හඳුනාගත හැකි ය.

රූපය 8 ඡායාරූපයේ ස්වදේශිකයන්ට පිටුපසින් ඉදි කරන ලද අට්ටාලයක් මත නැගී, වාඩි වී සිටින විදේශික වැවිලිකරුවන්ගේ ස්ථානගත වීම මඟින් බලය පිළිබඳව ප්‍රබල ප්‍රතිරූපක ගොඩනැගී ඇත. ඔවුන් ඡායාරූපයේ ඇස් මට්ටමෙන් ඉහළ පිහිටි අවකාශයක ස්ථානගත වීම හේතුවෙන් ප්‍රබලත්වයට පත්වේ. ඔවුන්ගේ සෘජු බැල්ම හා කම්කරුවන්ගේ හිස් මදක් පහතට නැඹුරු වීම යන කරුණු හේතුවෙන් විදේශිකයන්ගේ අධිකාරී බලය තීව්‍ර කෙරෙන අතර ස්වදේශිකයන්ගේ යටහත්-පහත් අවනත භාවය තහවුරු කෙරේ. ඒ අනුව ස්වදේශිකයන්ගේ හිසට ඉහළින් විදේශිකයන් සහිත අට්ටාලය පිහිටුවීමෙන් ද ස්වදේශිකයා පරයා නැගී සිටින විදේශික බලයේ ප්‍රබලත්වය සංකේතවත් කෙරේ.

යුරෝ-කේන්ද්‍රීය බල අධිකාරය, ප්‍රාචීනවාදී මතවාදය සහ ස්වදේශික දේහය

මුවර්ට අනුව, අධිරාජ්‍යය ගොඩනගන්නන්ගේ ප්‍රතිමූර්තිය වන්නේ උස් වූ, පළල් උර ඇති, ළා දුඹුරු පැහැති හිසකෙස් සහ නිල් පැහැති ඇස් ඇති වීරයෙකි (ද සිල්වා 2005: 175). මේ අනුව, වික්ටෝරියානු පිරිමිකමේ මූලික ගති ලක්ෂණ ලෙස සිරුර, ශරීරය මූර්තිමත් කිරීමේ ආකාරය, ශාරීරික ප්‍රයුක්තිය, නිර්භීතත්වය සහ වික්‍රමාන්විත බව යනාදී සාධක කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමුවී ඇත. ඊට සාපේක්ෂව විජිතවාදීන් විසින්

විජිතවාසී මානව දේහය පිළිබඳව ප්‍රතිරූප ගොඩනගන ලද්දේ එයින් ප්‍රතිපක්ෂ ආකෘතියකිනි. බහුතරයක් ඡායාරූප තුළ ස්වදේශික ශරීරය පිහිටුවා ඇත්තේ බොහෝවිට නො වැදගත් චරිතයක් හෝ යුරෝපීයාගේ යටත් වැසියෙකු බවට නැතහොත් යුරෝපීයාගේ සුව පහසුව වෙනුවෙන් කැපවී සිටින්නෙකු වශයෙනි (රූපය 1, 2).

රූපය 9 - Estate Workers, 1886, Photographer Unknown
සමූහ ඡායාරූපය තුළ විදේශිකයන් ඉහළින් ස්ථානගත වීම මඟින් ඔවුන් වෙතට ප්‍රමුඛ අවධානයක් යොමුවන අතර එනයින් යටත්විජිතකාරකයින්ගේ බල අධිකාරීත්වයන් විශද වේ.

ඇතැම් අවස්ථාවල භූමි දර්ශනය තුළ ස්වදේශික දේහය ස්ථානගත කර ඇත්තේ බෙහෙවින් අලස, මන්දෝත්සාහී ජන කොටසක්ය යන දෘෂ්ටියෙන් යුතුව ය. මානව සිරුර ස්ථානගත කිරීමේ දී එහි පරිමාණය ඉතා කුඩාවන අතර පසුබිම සඳහා විශාල අවධානයක් යොමු කර ඇත. පුරාවිද්‍යා ස්මාරක සහිත ඡායාරූප නිදසුන් වේ (රූපය 9). මෙම ඡායාරූපය තුළ ස්වදේශික සිරුර භාවිතා කර ඇත්තේ නටඹුන් වූ පුරාවස්තුන්ගේ විශාලත්වය මැනීමේ පරිමාණයක් වශයෙනි. මෙම ස්වදේශිකයාගේ ඉරියව් නිරූපණය කෙරෙන් බෙලහීනත්වය ප්‍රදර්ශනය වේ. ඒ අනුව, සාමාන්‍ය පුරුෂ සිරුරක පවතින පෞරුෂමය ලක්ෂණ මෙනයින් නිරීක්ෂණය නොවේ. ස්වයං උනන්දුවෙන් තොර, යටහත් පහත්, පුරුෂත්වයෙන් තොර, ස්ත්‍රී ස්වාභාවයෙන් යුතු චරිත ලක්ෂණ මෙම ඡායාරූපවල පොදු අනන්‍යතාවයන් වශයෙන් හඳුනාගත හැකි ය.

සමස්ථයක් ලෙස සැලකීමේ දී ස්වදේශිකයන්ගේ මුහුණු රූප රාමුවේ ඉදිරියට යොමු නොවී වම් පසට, දකුණු පසට හෝ පිටුපසට යොමු කිරීම තුළින් පුරුෂ පෞරුෂත්වය සැඟවීමටත් ස්ත්‍රී ලක්ෂණ අනාවරණය කිරීමටත් ශිල්පියා උත්සුක වී ඇත (රූපය 2). මුහුණ ඉදිරියට යොමුව ඇති පුරුෂ සිරුරුවල පවා දෙනෙත් පහළට හෝ ඉවතට යොමුව තිබේ. පුරුෂයෙක් සතු ජවය, තාරුණ්‍ය, පෞරුෂත්වය ආදී ලක්ෂණ ඉස්මතු නොකොට මනෝ ව්‍යාධියකින් පෙළන, බෙලහීන පුරුෂයින් ලෙස ඔවුන් හුවා දැක්වීමේ ශිල්පීය අවශ්‍යතාවය පූර්වෝක්ත නිදර්ශන ඇසුරින් තීව්‍ර කෙරේ. තත්කාලීන විදේශික පුරුෂ ආකෘති සමඟ සැසඳීමේ දී පූර්වෝක්ත නිදර්ශන ඔස්සේ ස්වදේශික පුරුෂත්වය සැඟවීමට ගත් උත්සාහයන් අධ්‍යයනය කළ හැකි ය.

මානව රූප අතර හමුවන විදේශික චරිත, ස්වදේශික දේහයට සාපේක්ෂව තරමක් විශාලව මෙන්ම ඉදිරිගාමී ලෙස සංරචනය කර තිබේ. සංඛ්‍යාත්මකව සැලකීමේ දී මෙම බහුතරයක් ඡායාරූප තුළ යටත්විජිත ස්වදේශික මානව නිරූපණයන් බහුල වුව ද ඔවුන්ගේ අභිනය පිහිටවීම් මඟින් නිරීක්ෂණය වනුයේ නිර්ප්‍රභූ භාවයකි. එනම් පහත්, අධම, මර්ධනයට ලක් වූ යන්න ප්‍රකට කෙරේ. අන්තෝනියෝ ග්‍රාම්ස්චිට අනුව, නිර්ප්‍රභූ යනු පාලක පන්තියේ ආධිපත්‍යයට නතු වන්නා ය (පතිරගේ 2005). ඒ අනුව, මෙහි පාලක පන්තිය නිරූපණය කෙරෙන දෘශ්‍ය ක්ෂේත්‍රය වනුයේ යට කී යටත්විජිත කාරකයා ය. මෙම ඡායාරූපය තුළ යටත්විජිත කාරක පක්ෂයේ නියෝජනය එක් චරිතයකට පමණක් සීමා වුව ද ඔහුගේ ඉරියව් මඟින් ස්වකීය ප්‍රභූ භාවය තහවුරු කර තිබේ (රූපය 3). ඇතැම් ඡායාරූප මඟින් නිරූපණය කෙරෙනුයේ කැමරා ශිල්පියාගේ විධානයට අනුව නතර කරන ලද ක්‍රියාකාරකම් සමූහයක එකතුවක් වුව ද ස්වදේශික ශරීරවල ඉරියව් හුදෙක් සාමාන්‍ය සිටගෙන සිටීමකට පමණක් සීමා කර තිබේ. ඊට සාපේක්ෂව යටත්විජිත කාරකයාගේ ප්‍රාණ පූර්ණ ඉරියව් නිරූපණයන් මඟින් ඔහුගේ අධිපතිභාවය සහ ස්වදේශිකයන්ගේ අප්‍රාණිකත්වය ඉස්මතු කර පෙන්වා තිබේ.

ශරීර ඉරියව් නිරූපණය මෙන්ම කායිකත්වය නිරූපණය මඟින් ද ප්‍රභූත්වය හිමිව ඇත්තේ යටත්විජිත කාරක පක්ෂය වෙතට ය. ඒ අනුව, දුඹුරු හම සහිත ස්වදේශික ශරීර අතර ඇති සුදු පැහැති කොකේෂියානු ශරීර ලක්ෂණ විශද කරවන පුද්ගල රූප සඳහා ඡායාරූපයේ කේන්ද්‍රීය අවධානයක් හිමිව ඇති බව නිරීක්ෂණය විය. එම විදේශික චරිතවල ස්ථානගත වීම අනුව ද සෙසු ස්වදේශික චරිතවල යටහත් පහත්, බෙලහීනත්වය අවධාරණයට ලක් කෙරේ. ඡායාරූපය මධ්‍ය ලක්ෂය නරඹන්නාගේ ඍජු අවධානයට ලක් වේ. ඇතැම් ඡායාරූපවල මධ්‍ය චරිතය වී ඇත්තේ යටත්විජිත කාරකයා ය (රූපය 1, 3, 4). එහි දී

ඡායාරූපයේ සමමිතික තිරස් හා සිරස් අක්ෂ ඡේදනය වන මධ්‍ය ලක්ෂය මත විදේශික ශරීරය නාබිගත කෙරේ. ඡායාරූපයේ මධ්‍යගත චරිතය ඍජුව නෙත ගැටීම හරහා ඔහු කෙරෙන් ප්‍රකාශිත බලය හා ප්‍රභුත්වය ආදී සංඥාවන් ද ඍජුව නරඹන්නා වෙතට ආමන්ත්‍රණය කරන අතර සෙසු පාත්‍ර වර්ගියෝ අවශේෂ ප්‍රාණීන් බවට පත් කෙරේ. ඉහත රූපවල දැක්වෙන පරිදි යටත්විජිත කාරකයා නියෝජනය කරන විදේශිකයන්ගේ හිස ඇස්මට්ටමේ පිහිටන අතර ස්වදේශිකයන්ගේ හිස ඇස්මට්ටමෙන් මදක් පහළටවන සේ පිහිටුවා තිබේ. විදේශික චරිත ඡායාරූපයේ දකුණු හෝ වම් අර්ධයටවන සේ පිහිටන අවස්ථාවන්හි දී එම චරිතය සෙසු ස්වදේශිකයන්ගෙන් වෙන්කොට දැක්වීමේ අරමුණින් අදාළ චරිතය ඉහළින් ස්ථානගත කිරීම හෝ ඉරියව් මඟින් අනෙකාගෙන් වෙනස් අභිනයන් සහිතව දැක්වීම හෝ ඇඳුම් පැළඳුම් මඟින් ප්‍රභුත්වය සංකේතවත් කිරීමට උත්සුක වී ඇත. නොඑසේනම් අනෙකාගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ප්‍රභුත්වය අත්පත් කොටගෙන තිබේ. රික්සෝ කරතත් දැක්වෙන ඡායාරූප නිදසුන් ලෙස දැක්විය හැකි ය. එම සෑම ස්ථානගත කිරීමක් හරහා ඡායාරූපය තුළ ස්වදේශික චරිත ද්විතීක අරමුණක් බවට පත්ව ඇත.

ඇඳුම් පැළඳුම් නිරූපණය මඟින් ද වඩාත් සුවිශේෂී වී ඇත්තේ යටත්විජිත කාරක පක්ෂයයි. ඡායාරූපවල නිරූපිත විදේශකියන් සියල්ලන්ම පාහේ උඩුකය සඳහා කමිසයක් සහ කබායක් (coat) ද යටිකය සඳහා දිගු කලිසමක් ද හිස තොප්පි ද පාද සඳහා බූට් සපත්තු ද පැළඳ සිටි යි. ස්වදේශික පුරුෂයින්ගේ ඇඳුම් විලාසිතාව වී ඇත්තේ උඩුකය නිරුවත්ව හෝ කමිසයක් සහ යටිකය සඳහා සරමකි. ඇතැම් අවස්ථාවන්හි දී එක් උරයක රෙදිකඩක් රුවාගෙන සිටි යි. ස්වදේශික ඇඳුම්හි පවතින යට කී විවිධත්වයන් ඉස්මතු කර පෙන්වීම හරහා ස්වදේශිකයා, යුරෝපීයාගෙන් වෙනස් වූ අරුම පුදුම, ප්‍රාථමික ජන කණ්ඩායමක් බවත්, ශිෂ්ඨකරණය කළ යුතු, නො දියුණු ග්‍රාම්‍ය ස්වභාවයත් නිරූපණය කෙරේ. එම එළඹවීම් වඩාත් තීව්‍ර කෙරෙනුයේ ස්වදේශික සිරුරු අතරට යටත්විජිත කාරකයාගේ දෘශ්‍ය රූපයක් ස්ථානගත කිරීම මඟිනි.

බටහිර යුරෝපීය අධිරාජ්‍ය ව්‍යාප්තිය තුළ ස්ත්‍රී හා පුරුෂ අස්මීයත්වයක් නිර්මාණය කිරීමේ දී ශරීරය, එහි ඇඳුම් සහ බාහිර හැසිරීම් ප්‍රධාන තේමාවක් ලෙස ඉස්මතු වේ (ද සිල්වා 2005: 178). ඉහත විමර්ශනයට ලක්කළ ඡායාරූප නියැඳිය, යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටියට අනුව ඇඳුම් නොමැති බව හෝ ඇඳුම් අවම බව ප්‍රාථමික ලක්ෂණයක් වශයෙන් කේතගත කෙරේ. ප්‍රාථමික යනු, ස්වාභාවික තත්ත්වයකි; පාසල් නො ගිය ආත්ම විශ්වාසයක් නොමැති ලැජ්ජාව, දේපල හිඟකම හා නිරුවත්බව හැර කිසිවක් හොඳින් නො පෙන්වීමයි (Levine 2008: 192). බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ව්‍යාප්ත කාලයේ දී බොහෝ යටත්විජිත ප්‍රබන්ධවලට අනුව,

ස්වදේශිකයන් නිතර අඩ නිරුවතින් හැර වෙනතකින් නොසිටි බව පෙන්වා දේ (Levine 2008: 192). නැවියන්, ගවේෂකයින් හා 17වන සියවසේ මිශනාරිවරුන් විවේචනය කළේ ඇඳුම් හිඟ ස්වදේශිකයන්ගේ ලැජ්ජාව ද මඳ බවයි. මේ අනුව සැලකීමේ දී පැහැදිලි වන ප්‍රස්තුතයක් නම් සෑම අවස්ථාවකදීම විජිතවාදීන් විසින් විජිතවාසී ප්‍රජාව හඳුන්වා දී ඇත්තේ ස්වකීයාගෙන් පහත් වූවෙකු වශයෙන් බවයි.

නිගමනය

මෙම අධ්‍යයන කාර්යය ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පයේ පළමුවන සියවස ඉක්මවන තරම් කාලයක් (ක්‍රි.ව. 1843- 1948) පුරා එහි චර්යා විමර්ශනය කරනු ලැබූවකි. ඡායාරූප ශිල්පයේ සම්ප්‍රාප්තිය අධිරාජ්‍යවාදී දේශපාලනික අවශ්‍යතාවයක් මත සිදු විය. කැමරාව මෙරටට රැගෙන ආවේත්, තත්කාලීනව ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීමේ නියැළී සිටියේත් යටත්විජිත ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය පාලකයින් සහ ඔවුන්ගේ නියෝජිතයන් වශයෙන් මෙහි පෙනී සිටි රාජ්‍ය නිලධාරීන් හා වැවිලි කර්මාන්තයේ නියුතු විදේශිකයන් ය. මේ අනුව, ඉතා පැහැදිලි ලෙස පෙනී යන කරුණක් වන්නේ ලක්දිව මුල්කාලීන ඡායාරූප ව්‍යවහාරය මුලුමනින්ම මෙරට වාසය කළ හා සංචාරය කළ බ්‍රිතාන්‍යයන්ට සීමා වූ බවයි. ඡායාරූප ශිල්පය මෙරට ජන සමාජයේ පංතිමය වරප්‍රසාදයක් විය. එමඟින් ස්වදේශික ජන සමාජයට කිසිදු මෙහෙවරක් සිදු නොවූ අතර, මෙරට පාලකයන් හා ඔවුන්ගේ නියෝජිතයන් අතර සම්බන්ධීකරණය උදෙසා ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වී ඇත.

අධ්‍යයන ප්‍රතිඵල අනුව, පහත සඳහන් නිරීක්ෂණයන් හඳුනාගත හැකි විය. ස්වදේශිකයන් ඡායාරූප ශිල්ප ක්ෂේත්‍රයේ කිසියම් හෝ ආධිපත්‍යයක් දැරීමට සමත්වී ඇත්තේ 1900න් පසුවය. 19 වැනි සියවසේ දී ස්වදේශිකයන්ගෙන් සිදු වී ඇත්තේ අන්‍යයින්ගේ අවශ්‍යතාව හා බලකිරීම හෝ නො දැනුවත්ව හෝ ඡායාරූපවලට පෙනී සිටීම පමණි. බහුතරයක් ඡායාරූපවල ස්වදේශික දේහය පහත් නො දියුණු යන යුරෝ-කේන්ද්‍රීය මතවාදය තුළ ස්ථානගත කර තිබිණි. ඇතැම් ඡායාරූප තුළ ස්වදේශික දේහය යටත්විජිතවාදීන්ගේ ශාරීරික සැකැස්මෙන් වෙනස්වන අතර ඇඳුම් පැළඳුම් භාවිතය මඟින් අපූර්ව, විවිධ යන ප්‍රාචීනවාදී ඇඟවීම් පිළිඹිබු කිරීම සඳහා අරමුණු කර තිබේ. එමෙන්ම යටත්විජිතවාදී මිනිස් ශ්‍රමය ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි ප්‍රවේශයක් වශයෙන් පෙන්වා දී ඇත. ස්වදේශික ඡායාරූප විමර්ශනයේ දී නග්නත්වය ප්‍රතිදෘශ්‍යකරණය මඟින් විජිතවාදීන්ගේ මූලික අපේක්ෂාව වූයේ තමා යටත්කරගත් භූමියේ වෙසෙන මිනිසුන්ගේ අශිෂ්ටත්වය ඉස්මතු කර පෙන්වීමයි. එමඟින් යුරෝපීයා හෙවත් යටත්විජිතවාදියාට ලෝකය දැකීමේ තිබූ ඌන දෘෂ්ටියත්

ඒ මත පදනම් වූ දේශපාලනික රුචිකත්වයක් මැනවින් විශද වේ. මේ අනුව, යටත්විජිත ස්වදේශික දේහය, යටත්විජිතවාදී බල දේශපාලනික ව්‍යාපෘතියේ ප්‍රචාරක හා වාර්තාකරණ මාධ්‍ය වශයෙන් පෙනී සිට ඇති බව පැහැදිලිවන අතර එමගින් ස්වකීය බලය සහ අධිකාරය ව්‍යංගවත් කිරීමේ අරමුණින් ස්වකීය ආස්ථානය මත සැලසුම්කරණය වූ බව නිගමනය කළ හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ

ආරියදාස, කීර්ති. 2004. *දේශපාලන විද්‍යාව: න්‍යාය, සංකල්ප, මතවාද.* පන්නිපිටිය: කතෘ ප්‍රකාශන

ගුණසේකර, උදිත. 2012. *ශ්‍රී ලාංකේය ඡායාරූප වංශය: සෙලුයිලොයිඩ් පටලයේ රැඳුණු ලාංකේය උරුමය පිළිබඳ විමසා බැලීමක්.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ඩන්කන්, කැරල් (පරිවර්තනය: අනෝලී පෙරේරා). 2008. "විසිවන සියවස මුල් යුගයේ පෙරටුගාමී චිත්‍ර තුළ පිළිබිඹුවන පුරුෂත්වය හා අධිපතීත්වය", *Art Leb: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, පස්වන සහ හයවන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව.

ද සිල්වා, ජනී. 2005. "සිංහල කතිකාව තුළ වික්ටෝරියානු පිරිමිකම සහ පුරුෂත්වය පිළිබඳ දේශීය කේත", *පයිීත*, තෙවන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

දිසානායක, විමල්. 2010. *නව විචාර සංකල්ප.* බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

නොක්ස්, රොබට්. 2001. *එදා හෙළදිව.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

පතිරගේ, ජගත් බණ්ඩාර. 2005. "පශ්චාත් යටත්විජිතවාදී කතිකාවට ප්‍රවේශයක්", *පයිීත*, තෙවන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

පෙරේරා, රංජිත්. 1993. නිර්ප්‍රභු පර්යාවලෝකය: මානසිකත්වය යටත්විජිතහරණයකට කිරීමේ ලා උපාය මාර්ගයකි". *ප්‍රවාද*, 5වන කලාපය. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

ශනාතනන්, ටී (පරිවර්තනය: සාමිනාදන් විමල්). 2008. "අනෙකාව තියුණු අවලෝකනයකට ලක් කිරීම: ලයනල් වෙන්ඩ්ට් සහ ඩේවිඩ් පෙයින්ටර්ගේ චිත්‍රවල පුරුෂ ශරීරය", *Art Lab: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, පස්වන සහ හයවන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. 1967. ඇඳුම, *සිංහල විශ්වකෝෂය 3වැනි කාණ්ඩය.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Bruce, Janine. 2010. "Representations of 'The Other' in Colonial Photography" , Image and Imagining the Pacific. [Online]. Available at: <https://mail.gogle.com/mail/#inbox/15824901b0ee3d5?projector=1> [Accessed 13 November 2016].

Gardon, Sophie. 2007. "Photography in Inda", Asia's Colonial Photographies. [Online].Available at:<https://iias.asia/sites/default/fils/IIASNL44_1011.pdf>[Accessed 13 November 2016].

Levine, Philippa. 2007. *States of undress Nakedness and the Colonial Imagination*. [Online]. Available at: <https://www.ncbi.nlm.nih.gov/pubmed/19069002> [Accessed 13 November 2016].

W. ADIKARAM and A.T.P WICKRAMASINGHE
University of Moratuwa - Sri Lanka

Vivienne Westwood and her Fashion Mantra

ABSTRACT

8. Regions of the country where the Gaelic-Irish language is recognized as the dominant, vernacular language

THE GLOBALIZATION OF IRISH STEP DANCE

EVOLUTION IN THE TWENTIETH-CENTURY

I suggest that the performance context of sean-nós dance, the contrasting evolutions of sean-nós dance and step dance, and the stark differences in kinaesthetic embodiment of those two dance forms are the main contributing factors to the revival of sean-nós dance in twenty-first century Ireland. Sean-nós dance is a growing practice of performative local culture, while step dance continues to experience the effects of globalization.

The popularity of Irish step dance and step dance competitions grew throughout the twentieth century. The national perception of an Irish step dancer was a young female with curly hair, a fancy costume, and high, athletic movements (Foley 2001: 36). Developments in dance shoes, particularly the hard shoes, allowed for the evolution and invention of dance steps. Step dance started drawing on other dance forms, as well. Taking from ballet, dancers began incorporating higher jumps and kicks into their performances, which contrasted the former tradition of using low levelled movements (Foley 2013: 39, Phelan 2014: 94). Stages became larger, which resulted in more travelling movements, another divergence from the way dance had been.

Riverdance

On April 30, 1994, in the midst of the Celtic Tiger[9], a seven-minute performance called Riverdance took place at The Eurovision Song Contest, whose transnational television audience of three hundred million people thrust a simplified image of Irish step dance into the world of popular culture. This performance, which later became a full-length production and combined dance, music, lighting, costumes and technology, put Irish dance on the global map. The theatrical manner of Riverdance made it accessible for large audiences and 'contributed to what is currently a global homogenization of the representation of Irish step dance' and Irish national culture, in general (Foley 2001: 40).

9. An economic boom lasting for about 15 years, caused by increased consumption and outward investment. Ireland became increasingly secular, entrepreneurial, and economically competitive.

Commodification of Step Dance

A result of the Riverdance phenomenon was Irish dance schools doubling in size. In fact, while at the University of Limerick in the spring of 2018, I conducted a series of interviews with students studying Irish dance. Student two (personal communication, spring 2018) stated in her interview that her mom put her in Irish step dance so that she "could be just like Riverdance" (2018). Student four (personal communication, spring 2018) stressed the Riverdance-era's influence on Irish dancers by saying, "I suppose everyone's dream is Riverdance". Masero (2010: 14)

further demonstrates the effect of Riverdance, saying that the growth in Irish step dance was so extreme that the 1999 All-Ireland dancing championship lasted for seven days, as opposed to in 1930, when it was only two days long. People around the world bought into the popularity of Riverdance and wanted to participate in its glamour, thus expanding and commodifying Irish step dance.

Adding to the commodification of Irish step dance are vendors and costumes. At competitions and commercial performances like Riverdance and Lord of the Dance, vendors sell all sorts of souvenirs. For dancers, a sturdy pair of hard shoes can cost upwards of £200, or around $227. A state-of-the-art costume generally costs between £400 to £800, and then there are costs for accessories, such as embroidered tiaras, dress covers, wigs, and headbands (Brennan 1995: 157). Because multiple dancers compete on stage at the same time, costuming may draw a judge's attention to that dancer. All of this is done in part to "meet the changing demands of Irish step dancers within the more affluent, modern and globalized Celtic Tiger Ireland" (Foley 2013: 185). However, it is the same commodification of Irish step dance that has served as a catalyst for the emergence of marginal dance practices (Foley 2001: 34). Those who do not have the financial means to spend thousands of dollars cannot as easily participate in competitive step dance culture, adding to the appeal of alternative dance practices. With this, space has been created for sean-nós dance to regain momentum in the twenty-first century.

INSTITUTIONALIZATION OF SEAN-NÓS DANCE

The revival of sean-nós dance is also due to its institutionalization that began in the mid-twentieth century. In the 1960s during the Gaeltacht Civil Rights Movement, where people protested insufficient representation of sean-nós in the annual An tOireachtas[10], sean-nós song, dance, and music has been gaining more attention. In 1975, the Oireachtas in Cois Fharraige was held in Connemara, rather than Dublin, which had been the normal location (Brennan 1999: 140-141). In the 1970s sean-nós dance competitions were introduced to the country. However, they remain locally based and lack the bureaucratic features the Irish Dancing Commission put in place for step dance competitions. For instance, competitors often do not submit their names until the last minute, so the element of spontaneity, inherent in sean-nós, is retained. Following the competition, it is common for all participants and any audience members to dance together (Brennan 1999: 136-140). Advertisements for sean-nós dance competitions are written mostly in the Irish language, thus resisting the effects of globalization and remaining a local performance of Irish national culture (Wulff 2007: 21). This proves to be an effective method, as well. Liam Maolaodha, director of Oireachtas na Gaeilge[11], mentioned

10. A mixture of social events and arts competitions held annually in Dublin

11. Ireland's oldest arts festival

that the number of young dancers participating in sean-nós dance has been increasing since the beginning of the twenty first century (Muiri 2001). The groundedness of sean-nós dance competitions in local culture is one aspect of the performance context contributing to its current revival.

The legitimization and institutionalization of sean-nós dance has occurred in other ways, as well. Sean-nós dance classes are now offered, whereas, people used to teach themselves by watching other dancers perform (Wulff 2007: 127). Additionally, within the past two years, sean-nós dance has been introduced into the University of Limerick Irish dance program, another tangible piece of evidence of the sean-nós revival.

DIFFERENCES BETWEEN SEAN-NÓS DANCE AND STEP DANCE

Since sean-nós dance is the main performance of national culture that has regained momentum in the post-Riverdance era, it is important to analyze its movements to more comprehensively understand its revival. Jordan interviewed a well-known dance prodigy from County Clare by the name of O'Dea who claims that the main appeal of sean-nós dance is that it is 'natural', whereas, "modern dancers are almost like athletes, and once you reach 40 or 45 years of age, you can't do it anymore" (1998: 3). One of the core aspects of sean-nós is its ability to bring individuals of all ages together. Wulff (2002: 128) discusses how at an informal sean-nós dance competition in a pub in the small village of Carraroe, the competitor's ages ranged from 10 years-old to 50 years-old, and it was the man in his 50s who ended up winning. With competitive step dancing, once dancers turn 25 years old, they are no longer allowed to compete. Additionally, I participated in a sean-nós dance workshop while in Limerick, and the man who taught it was easily in his late 70s. His age legitimized his skill; students had immense respect for him and the steps he was teaching. Sean-nós dance is also more gender inclusive, whereas step dance continues to be a female dominated dance form. My step dance professor at the University of Limerick (personal communication, spring 2018) made several comments to me about how male dancers have to embody a hyper-masculinity if they want to be even remotely successful when competing against females in step dance. There are more possibilities for gender expression and age variance with sean-nós dance than with step dance, allowing for a sense of togetherness across differences - another contributing factor to its current revival.

O'Connor (2013: 84) supports this by arguing that community is cultivated through the social context and kinaesthetics of sean-nós dance. For some, the motive to dance sean-nós is for the craic[12], which student one (personal communication, spring 2018) agreed with during her interview. Student one and student three (personal communication,

12. Irish vernacular for 'fun'

spring 2018) emphasized that sean-nós dance is about enjoyment, and step dance has become extreme and tends to focus on technique and a certain bodily standard. Not only that, but the informal environments in which sean-nós dance takes place serve as social levelers (O'Connor 2013: 85-86). Social class, gender, religion, socioeconomic status, and all other dividing differences are disregarded, and only the dance and music matter. In fact, 'sean-nós dancing will get people here on a kind of 'communal high" (Brennan 1999: 142).

Embodied Differences

While studying in Ireland, I experienced drastic differences between sean-nós dance and hardshoe step dance through personal embodiment of the dance forms. Step dance involves being stiff and upright. My step dance professor (personal communication, spring 2018) would constantly tell me to stick my chest out more, keep my legs straight while landing a jump, and turn my feet out past what is comfortable. One of the first days of class, he told me that if I wasn't in pain, then I wasn't doing it correctly. However, the unnatural bodily standard of step dance can be quite dangerous and make dancers more prone to injury. The footwork is also quite intricate in hardshoe step dancing; the jumps should be high and the legs should be flexible. Student five (personal communication, spring 2018) stated in her interview with me that when competing in hardshoe step dance, she focuses on being strong and powerful. Step dancing involves pushing the physical boundaries of the body and trying to outdo other dancers and oneself. Step dance continues to be for those who are very physically-abled.

Conversely, in my sean-nós dance class, I felt relief from letting my upper body relax and my knees bend, allowing myself to breathe, and letting my body respond naturally to what my feet were doing. I found this dance style easier to embody. In sean-nós dance, the feet remain close to the ground; there are no physically demanding jumps. Unlike with step dance, I felt no pressure to conform to a certain body standard or shape. Another defining characteristic of sean-nós dance is improvisation, which contributes to a feeling of individuality in the dance form. Not only is this dance form deeply rooted in Irish culture and history, but it simultaneously promotes individual expression within a community context. Nowadays, people are becoming more concerned with individual identity and having space to explore that identity. Sean-nós dance allows for that, but in a supportive and inclusive setting, which adds to its increasing ability to serve as a performance of national culture.

Music differences

Traditional Irish music plays a significant role in Irish culture, arguably more so than Irish dance, and is thus important to consider when contrasting step dance with sean-nós dance. The music in sean-nós is intrinsically linked to the dancing; the dancer and musicians compose together as the performance unfolds. While sean-nós dance is performed to live music, competitive step dancing uses recorded music. Student two (personal communication, spring 2018) found that using recorded music, along with the evolution of the steps, was sacrificing too much integrity of step dance.

As footwork in step dancing has evolved and become more intricate, the music has had to become slower to accommodate for the dancers. The dance prodigy O'Dea contributes that competitive step dancers do not know the history behind the music or their steps anymore because of the extreme evolution in the era of globalization (Jordan 1998: 2). Four out of five students (personal communication, spring 2018) interviewed mentioned that dancing to live music adds a sense of liveliness and appeal to any form of Irish dance, but especially sean-nós dance . When it comes to sean-nós dance, Wulff goes as far to say that the music helps do the dancing. She quotes Paraic Hopkins, a previous winner of the Carraroe Sean-nós Competition, "When you see somebody who enjoys [sean-nós]... it is the music that is holding him up!" (Wulff 2007: 20).

CONCLUSION

I conclude that the qualities inherent to sean-nós dance - the emphasis on individual expression, inclusivity and community, and the connection to music - contribute to its revival in the twenty first century. The movements and kinaesthetic frameworks in sean-nós dance also exemplify how the physical movements of performed national culture can significantly lend to its ability to serve as such. The revival of sean-nós dance in twenty-first century Ireland is also predicated on the globalization of step dance. Nowadays, Irish step dance is a hyper-athletic, global commodity, much less focused on performing Irish national culture, which was the original reason for its invention during the Gaelic Revival. Thus, it can be said that the effects of globalization on invented traditions and the dynamic quality of national culture in the present day create space for marginalized, embodied practices of national culture to reemerge. This analysis also demonstrates the need to study both conceptual and kinaesthetic frameworks to better understand the shaping of national culture through physical practices.

REFERENCES

Barbour, K. 2011. *Dancing Across the Page: Narrative and Embodied Ways of Knowing*. Chicago: The University of Chicago Press.

Brennan, H. 1999. *The Story of Irish Dance*. Lanham: Roberts Rinehart Publishers.

Brown, T. 1985. *Ireland: A Social and Cultural History, 1922 to the Present*. New York: Cornell University Press.

Dyck, N. & Archetti, E.P. 2003. *Sport, Dance and Embodied Identities*. Oxford: Berg Publishing.

Edensor, T. 2002. *National Identity, Popular Culture and Everyday Life*. New York: Berg Publishing.

Foley, C.E. 2001. 'Perceptions of Irish Step Dance: National, Global, and Local', *Dance Research Journal*, vol. 33, no. 1, pp. 34-45.

--- 2013. *Step Dancing in Ireland: Culture and History*. Farnham: Ashgate Publishing.

Hannerz, U. 1991. 'Scenarios for Peripheral Cultures' in AD King (ed.), *Culture, Globalization and the World- System: Contemporary Conditions for the Representation of Identity*. Minnesota: University of Minnesota Press.

Harris, E. 2009. 'Ideological Foundations of Nations and Nationalism', *Nationalism: Theories and Cases*. Edinburgh: Edinburgh University Press.

Henigan, J. 1991. 'Sean-nós in Donegal: In search of a definition', Ulster Folklife, no. 37, pp. 97-105.

Hobsbawm, E. & Ranger, T. 1983. *The Invention of Tradition*. Cambridge: Cambridge University Press.

Hohmann, S. 2010. 'National Identity and Invented Tradition: The Rehabilitation of Traditional Medicine in Post-Soviet Uzbekistan', *The China and Eurasia Forum Quarterly*, vol. 8, no. 3, pp. 129-148.

İnaç, H. & Ünal, F. 2013. 'The Construction of National Identity in Modern Times: Theoretical Perspective', *International Journal of Humanities and Social Science*, vol. 3, no. 11, pp. 223-232.

Jordan, K. 1998. 'Sean Nos Step Dancing - It's A Living Tradition', *The Boston Irish Reporter*, 29 Aug.

Kaufmann, E. & Zimmer, O. 1998. 'In Search of the Authentic Nation: Landscape and National Identity in Canada and Switzerland', *Nations and Nationalism*, vol. 4, no. 4, pp. 483-510.

Masero, A. 2010. 'The Changes in Irish Dance Since Riverdance' Honors thesis. Kentucky: Western Kentucky University.

Muiri, P.O. 2001. 'Dancing as Gaeilge: Sean-nos dancing? It crashes through the language barrier at Ireland's oldest arts festival, Oireachtas

na Gaeilge, writes Pol Muiri, who previews this weekend's events in Dingle' *The Irish Times*, 2 Nov., p. 12.

O'Connor, B. 2013. *The Irish Dancing: Cultural Politics and Identities, 1900-2000*. Cork: Cork University Press.

Phelan, S. 2014. *Dance in Ireland: Steps, Stages and Stories*. Cambridge: Cambridge Scholars Publishing.

Skey, M. & Antonsich, M. 2017. *Everyday Nationhood: Theorising Culture, Identity and Belonging After Banal Nationalism*. London: Palgrave.

Thomas, H. 2003. *The Body, Dance and Cultural Theory*. London: Palgrave.

Wulff, H. 2007. *Dancing at the Crossroads: Memory and Mobility*. New York: Berghahn Books.

--- 2002. 'Yo-Yo Fieldwork: Mobility and Time in a Multi-Local Study of Dance in Ireland', *Anthropological Journal on European Cultures*, vol. 11, pp. 117-136.

හර්ෂණ මධුෂංක විතාරණ
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

සබරගමු කලවාන නර්තන රංග ශෛලියේ භාවිත ඩැක්කි වාදන කලාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

සංක්ෂේපය

ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායත්‍රයෙහිම අන්තර්ගතව ඇති රංග මෙවලමක් ලෙස 'උඩැක්කිය' වාද්‍ය භාණ්ඩය සඳහන් කළ හැකි ය. මෙය සම්ප්‍රදායත්‍රයෙහි භාවිතයට ගැනෙන්නේ ශාන්තිකර්ම පද්ධතිය මූලික කරගෙන ය. පහතරට නර්තන සම්ප්‍රදායේත්, උඩරට නර්තන සම්ප්‍රදායේත්, සබරගමු නර්තන සම්ප්‍රදායේත් කලවාන රංග ශෛලියේ හැර අනෙකුත් ශෛලීන් හී උඩැක්කිය නමින් භාවිතයට ගැනේ. නමුත් කලවාන ශෛලියට ප්‍රවිෂ්ට වනවිට දක්නට ලැබෙන්නේ එය 'ඩැක්කිය' නමිනි. විශේෂ උරපටියක් භාවිතා කරමින් උරහිසෙහි එල්ලාගෙන වාදනය කරනු ලබන මෙම වාද්‍ය භාණ්ඩය ශාන්තිකර්ම අවස්ථාවේ දී ඉතාමත් කෙටිකාලයක් ඇතුළත වාදනයට සුදුසු පරිදි සකස් කර ගැනීම විශේෂත්වයකි. කලවාන ශෛලියේ ඩැක්කිය උඩැක්කියට සාම්‍යත්වයක් දක්වන අතර එය වඩාත් සමීප වී ඇත්තේ පහතරට නර්තන සම්ප්‍රදායේ උඩැක්කියට ය. පහතරට නර්තන සම්ප්‍රදායේ උඩැක්කියට සාම්‍ය වන නමුත් කලවාන ශෛලියෙහි දී එය ඩැක්කිය වශයෙන් භාවිතයට ගැනීමෙන් පෙනී යන්නේ එය කලවාන සම්ප්‍රදායෙහි සුවිශේෂී වී ඇති බවයි. කලවාන ශෛලියේ ඩැක්කි වාදනය නමින් භාවිතයට ගැනෙන්නේ එහි ශාන්තිකර්ම අතර එන ගී මඩු

ප්‍රමුඛ පද
ඩැක්කිය, සබරගමු, කලවාන, වාදනය

රංගනයෙහි ය. වර්තමානයේ සබරගමු ශාන්තිකර්ම අතරින් ගිලීහී යමින් පවතින ගී මඬු රංගනයේ කෝල්මුර රංගනයන්ගේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ ඩැක්කිය යි. එම නිසා කලවාන ශෛලියෙහි සුවිශේෂ වාද්‍ය භාණ්ඩයක් ලෙස ද ඩැක්කිය සඳහන් කළ හැකි ය. උඩැක්කියට වඩා යම් ප්‍රමාණයකින් විශාලත්වයකින් යුක්ත වූ ඩැක්කි භාවිතයේ සහ එහි ව්‍යුහාත්මක ආකෘතියේ ද සුවිශේෂත්වයක් දක්නට ලැබේ. එසේම 'ඩැක්කි නර්තන' කලාවක් ද එහි අන්තර්ගත බව ප්‍රත්‍යක්ෂ විය. එනිසා කලවාන ශෛලියේ 'ඩැක්කි වාදන නර්තන කලාව' සබරගමු සම්ප්‍රදායේ අනෙකුත් ශෛලීන්ට සාපේක්ෂව විශේෂත්වයක් ගනු ලැබේ. මෙකී හේතුවෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කර එහි වැදගත්කම විෂයානුගත ප්‍රජාවට හඳුන්වා දීම කාලෝචිත යැයි සඳහන් කළ හැකි ය. ඩැක්කි වාදන කලාව පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේ දී ඊට අදාළ ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කිරීමත්, අදාළ ශාන්තිකර්මවලට සහභාගී වන ශිල්පීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත්, ප්‍රායෝගිකව ශාන්තිකර්ම නැරඹීම හා පාරම්පරික ශිල්පියෙකු වශයෙන් ශාන්තිකර්මවලට සහභාගී වී ලැබූ අත්දැකීම් පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරිණ.

ඩැක්කි වාදනය හා බැඳි ඓතිහාසික පසුබිම

විවිධ හැඩයන්ගෙන් ප්‍රමාණයන්ගෙන් යුත් බෙර වර්ග රාශියක් ලෝකය පුරා දක්නට ලැබේ. එසේ භාවිතා කරන ලද අවනද්ධ භාණ්ඩයන් අතරට ගැනෙන මැදින් සිහින් ආකාරයෙන් යුත් ඩැක්කියට හිමිවන්නේ සුවිශේෂත්වයකි.

උඩැක්කිය, ඩැක්කිය, ඩැකබෙර, ඪක්ක, ඩමරු, ඩමරුග, බුඩුකේ, උඩුක්කු, එඩැක්ක, ඉඩැක්ක, තිමිලා, හුරුක් යන නම්වලින් සඳහන් බෙර වර්ග සුළු සුළු වෙනස්කම් සහිත ව එක ම බෙර විශේෂයකට අයත් වාද්‍ය භාණ්ඩ වේ. එහෙත් මෙම වර්ගයේ බෙර සියල්ල ම පාහේ ශිව දෙවියාගේ 'ඩමරුව' නැමැති සෙලවුම් බෙරය මුල්කොට ඇති වූ ප්‍රභේදයන් ය. *දළදා සිරිතෙහි* 'ඩමර පදය' 'ඩවුර' වශයෙන් බිඳී ආ බව පණ්ඩිත සෝරත හිමියෝ පවසති (සෝරත 2009).

ඩමරුව නිර්මාණය සම්බන්ධයෙන් මත කිහිපයක් දක්නට ලැබේ. එනම් ශිවගේ තාණ්ඩව නර්තනයන් ඉදිරිපත් කිරීමේ දී පොළොවේ ගැටීම අනුකරණය කරමින් ගනේෂ, ඩමරුව නිර්මාණය කළ බවයි (පීරිස් 2005). තවත් මතයක් වනුයේ ශ්‍රියා කාන්තාවගේ හැඩය අනුගමනය කරමින් ඩමරුව නිර්මාණය වී ඇති බවයි. විශේෂයෙන් ඩමරුව කබලින් රැකෙන යෝගීන්ගේ වාද්‍ය භාණ්ඩයක් බව *කුවේණි අස්න සන්නයෙහි* සඳහන් වේ (ඤාණවිමල හිමි 1960)

උඩැක්කියේ මාතෘ භූමිය භාරත දේශය වුව ද ප්‍රාන්තමය වශයෙන් හා කාලීන වශයෙන් විවිධ නම්වලින් මෙම වාද්‍ය භාණ්ඩය හඳුන්වා ඇත. 'ගාන පටහ' යනු උඩැක්කිය හැඳින්වීම සඳහා යෙදුණු නාමයකි. සිරි

රහල් හිමියන් විසින් ලියන ලද *පංචිකා ප්‍රදීපය* නැමති ග්‍රන්ථයේ සඳහන් කරනුයේ,

"භරත සතරෙහි දසඟුලක් පමණ දිග ඇති මැද සිහින් පසඟුලක් පමණ මුඛ ඇති තන්ත්‍රී බද්ද වූ ගාන පටහ පණ වන මැයි කීනු" යනුවෙනි (රහල් හිමි 1957).

ද්‍රවිඩ භාෂාවේ 'උඩුක්කෙ' යන වචනයට සිංහල භාෂාවේ දී උඩැක්කිය යන්න යොදාගෙන ඇති බවත් එය මැද භාගය සිහින් වූ නිසා ඒ නමින් හැඳින් වූ බවත් සඳහන් කරනු ලබයි (මුදියන්සේ, 1997). මෙසේ උඩැක්කියට සමාන වාද්‍ය භාණ්ඩ රැසක් භාරත ඉතිහාසය පුරා ම දක්නට ලැබෙන අතර මෙම භාණ්ඩ භාවිතා කරන ලද්දේ ඉතාමත් භක්තිපූර්වකව ගීත ගායනා සඳහා ය. දේවාල සංගීතය සඳහා යොදා ගනු ලබන මෙම වාද්‍ය භාණ්ඩ කර්ණාටක මයිසූර් ප්‍රදේශයේ හඳුන්වනු ලබන්නේ 'ඩමරුගා' නමිනි. 'බුඩු බුඩුකෙ' නමින් හඳුන්වනු ලබන්නේ ඉන්ද්‍රජාලකයින්, විජ්ජාකාරයින් පාවිච්චි කරනු ලබන වාද්‍ය භාණ්ඩ ය. 'උඩුක්කු' හෙවත් 'උඩුක්කෙයි' නමින් හඳුන්වනු ලබන්නා වූ අඩියක් පමණ දිග මෙම ආකෘතියේ ම වාද්‍ය භාණ්ඩ, වීදි ගායකයින් හා ශාස්ත්‍රකරුවන් විසින් භාවිතා කරනු ලැබී ය (කෝට්ටේගොඩ 1998). මෙය ලංකාවේ භාවිතා කරනු ලබන උඩැක්කියට සමාන ය. 'එඩැක්ක' හෙවත් 'ඉඩැක්ක' නමින් භාවිත වාද්‍ය භාණ්ඩයක් කේරළ ප්‍රාන්තයේ දක්නට ලැබේ.

ඩැක්කිය හා උඩැක්කියට සමාන වාද්‍ය භාණ්ඩ රාශියක් මෙරට භාවිතා කර ඇති බව හමුවන සාධක අනුව පැහැදිලි වේ. පටහය 'මහ උඩැක්කිය' නමින් ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයෙහි සඳහන් කරයි (හරිස්චන්ද්‍ර 2005). 'පනාබෙර' යන නාමය ද උඩැක්කිය හැඳින්වීම සඳහා යෙදුණු වචනයක් වන අතර පනාබෙර ගායනයට තාලය සැපයෙන කුඩාබෙර විශේෂයක් බව සිරි රහල් හිමියන් සඳහන් කරනු ලබයි. 'ප්‍රවණ භේරී' යන නාමය ද උඩැක්කිය සඳහා යෙදුණු පර්යාය ශබ්දයක් වේ (විජේවර්ධන 2003). ඩැක්කිය කුඩාබෙර විශේෂයක් බවත් 'දෙණ්ඩිම බෙරය' ලෙස *සුමංගල ශබ්දකෝෂයේ* සඳහන් කරයි (සෝරත හිමි 2009).

මෙසේ භාරතයෙන් මුළු ලෝකය පුරා ම උඩැක්කි ස්වරූපය දරන වාද්‍ය භාණ්ඩ ප්‍රචලිත වී ව්‍යාප්ත විය. එහෙත් ප්‍රමාණයෙන්, නාමයෙන්, වාදන රීතියෙන්, සමාජ සම්බන්ධතාවන්ගෙන් ඒ ඒ රටවල දී වෙනස්කම් වලට භාජනය වී ඇති බව සඳහන් කළ යුතු ය. 'හෝරා ගෝල බෙරය' ලෙස ලෝකය පුරා ප්‍රචලිත මෙම ආකෘතියේ වාද්‍ය භාණ්ඩ ජපානයේ 'සුසුමි' නමින් ද, කොරියාවේ 'චන්කෝ' නමින් ද, තායිලන්තයේ 'බැන්ඩෝ' නමින් ද, පැපුවා නිව්ගිනියාවේ 'කුඳු' නමින් ද දකුණු අප්‍රිකාවේ 'කැලැන්ඩා' නමින් ද හඳුන්වනු ලබයි.

මේ අයුරින් උඩැක්කිය හා සම්බන්ධ විවිධ නාමයන් දක්නට

ලැබෙන අතර මෙරට භාවිතා කරනු ලබන උඩැක්කි, ඩැක්කි යම් යම් වෙනස්කම් අනුව දේශීය ලක්ෂණයන්ට මූලිකත්වය දෙමින් ගොඩනැගී ඇත. මේ අයුරින් ඩැක්කියේ ප්‍රභවය මෙරටට පැමිණ එය වාදන කලාවක් වශයෙන් දියුණුවට පත් විය. විශේෂයෙන් පත්තිනි ඇදහීම මෙරට මුල් බැසගැනීමෙන් පසු පූජාකර්ම බිහිවීමත් සමඟ මෙම වාද්‍ය භාණ්ඩය බහුල වශයෙන් යොදාගත් බව සිතිය හැක. ජෝන් ඩේවිඩ් නැමති විදේශ ජාතිකයා ලංකාවේ සමාජ සංස්ථාවේ ඉතා ජනප්‍රියව පැවති උඩැක්කි වාදන කලාව පිළිබඳ මෙසේ සඳහන් කරයි.

> උඩැක්කි වූ කලි ජනප්‍රියත ම ගෘහ සංගීත භාණ්ඩය යි. හඬ නගා කවි කීම සඳහා ද, ගීතයට අනුව වාදනය කිරීම සඳහා ද මෙය භාවිතා වේ. රාත්‍රී කාලයේ සිංහලයන්ගේ විශේෂයෙන් උසස් පන්තියේ ගෙවල් වලින් මෙහි හඬ බොහෝ විට නික්මෙයි. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් මීට කන් දෙමින් පෑ ගණන් ගත කරති. මෙහි හඬින් නළවනු ලැබුවෝ නිදි දෙව් දුව වැළඳ ගැනීමට පුරුදුව සිටිති. මිහිරි කවි සහ මෘදු උඩැක්කිය තරම් සිත සතපන අන්කිසිවක් නැතැයි (සෝමරත්න 1967).

මෙරට උඩැක්කි වාදන කලාවක් පැවති බවට හමුවන සාධක ඉතාමත් විරල ය. විවිධ කාල වකවානුවල දී හමුවන නොයෙක් සාධක මත උඩැක්කි, ඩැක්කි නමින් හඳුන්වනු ලැබූ වාද්‍ය භාණ්ඩයන් ලක්දිව සමාජයේ භාවිතා වූ බව දක්නට ලැබේ. පුරාවිද්‍යාත්මක සාධක පමණක් නොව ඒ ඒ යුගයන් හි ලියවුණු විවිධ කෘතීන් හී උඩැක්කිය, ඩැක්කිය පිළිබඳව සඳහන් වී තිබීම උඩැක්කි වාදන කලාවක් එකල දියුණු වී තිබූ බවට සාධක වේ.

අනුරාධපුර ලෝවාමහාපාය වාමන රූප අතර උඩැක්කිය දක්වේ (බණ්ඩාර 2009). මෙහි වාමන රූපකම් අතර උඩැක්කිය කරේ එල්ලාගෙන ඇති රූ මෙන් ම උඩැක්කිය බඳ මධ්‍යයේ සිහින් කොටසින් අල්ලා වයන රූපකම් ද වේ. යාපහුවේ දළදා මැදුරේ පියගැට පෙළේ වාමන රූප අතරේද, ක්‍රි.ව 7 වන සියවසට අයත් මැදිරිගිරිය වටදාගැබ කණු හිස් වලදී ද මෙකී උඩැක්කියේ රූපකම් දක්නට ලැබේ.

එමෙන්ම යාපහුව නියම්ගම්පාය, බෙන්තර ගලපාත විහාර, ගඩලාදෙණිය විහාර නියම්ගම්පාය විහාරය, පනාපිටිය අම්බලම මෙන් ම පොළොන්නරු යුගයෙන් සොයාගත් උරහිසින් එල්ලාගත් උඩැක්කි වාදනය කරන ශිල්පියෙකුගේ ගල් කැටයම හා දැදිගම කොටවෙහෙරෙන් සොයාගත් එල්ලෙන ඇත් පහනේ උඩැක්කි වාදන රූකම් ද මෙරට ඩැක්කි, උඩැක්කි භාවිතය පිළිබඳ සාක්ෂි සපයයි.

සිංහල ථූප වංශයේ දී දුටුගැමුණු රජු විසින් කරවන ලද රුවන්වැලි මහා සෑය බඳින ස්ථානයට රජු පැමිණෙන ආකාරය විස්තර කරන අවස්ථාවේ දී විවිධ වූ වාද්‍ය භාණ්ඩ වාදනය කළ බව සඳහන් වේ. ඒ අතර "මිහිගු

බෙර, පටහ ලොහා බෙර, තප්පු තලප්පර, වීරන්දම් ඩැක්කි, උඩැක්කි, තම්මැට, රන රඟ .... " ආදී වශයෙන් සඳහන් වේ (වනරතන 1986).

කාව්‍යශේඛරයෙහි ඩැක්කි, උඩැක්කි නාමය සඳහන්ව ඇත. එහි "ඩැක්කි, උඩැක්කි බෙර මිහිඟු මද්දල" යනුවෙන් සඳහන් වේ (ඤාණවිමල හිමි, 1969).

තිසර සංදේශයෙහි දැදිගම්පුර රාජසභා නැටුම් විස්තරයෙහි,

"තහලම් කළ බෙර තම්මැට පට තත්තිරි ඩමුරු
තබමේ ඩැකබෙර බොම්බිලි වීණා මිණි රුසිරු"

යනුවෙන් සඳහන් වේ (ජයතිලක 1991).

මේ අනුව පසුකාලීනව ලියවුණු සංදේශ කාව්‍යයන්හී ද ඩැක්කි, උඩැක්කි නාමය සඳහන් ව ඇත (අරංගල 1987). *ථූපවංශයෙහි* දක්වන තූර්ය භාණ්ඩ නාමලේඛනයෙහි ඩැක්කි, උඩැක්කි නාමය සඳහන් වේ. මේ අයුරින් ඩැක්කි උඩැක්කි නාමය හමුවන අතර එය දීර්ඝ කාලයක් තිස්සේ මෙරට සමාජයේ ජනප්‍රියව පවතින්නට ඇතැයි සිතිය හැක.

කලවාන ශෛලියෙහි භාවිත ඩැක්කි වාදන කලාව

පූජනීය වාදන භාණ්ඩයක් ලෙස සලකනු ලබන ඩැක්කිය සබරගමු නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්ම අවස්ථාවල දී භාවිතයට ගෙන ඇත. නොයෙක් හේතූන් නිසා අභාවයට ගිය කලා ශිල්ප අතර සබරගමු ඩැක්කි වාදන කලාවට හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි. සබරගමු නර්තන සම්ප්‍රදායේ කලවාන, බළන්ගොඩ, රත්නපුර හා බදුල්ල යනුවෙන් ශෛලීන් හතරක් ව්‍යාප්ත වී පවතී. නමුත් මෙම ශෛලීන් අතරින් ඩැක්කිය ශාන්තිකර්ම අවස්ථාවලදී භාවිතා කරනු ලබන්නේ කලවාන, බළන්ගෙ ාඩ හා බදුල්ල යන ශෛලීන් තුනේ පමණි. මෙම ශෛලීන්ට අමතරව අටකලන්පන්න ප්‍රදේශයේ පත්තිනි දේවාලය ආශ්‍රයෙන් පවත්වනු ලබන පහන්මඩු ශාන්තිකර්මයේ දී ඩැක්කි වාදනය සිදු කිරීම දැක ගත හැකි වේ. බළන්ගොඩ, බදුල්ල යන ශෛලීන් දෙකේ සහ අටකලන්පන්න ප්‍රදේශයේ මෙම වාද්‍ය භාණ්ඩය 'උඩැක්කිය' යන නාමයෙන් හඳුන්වනු ලබන අතර කලවාන ශෛලියේ 'ඩැක්කිය' යනුවෙන් හඳුන්වනු ලැබේ. ශාන්තිකර්ම අවස්ථාවේ දී ඩැක්කි වාදනය සිදු කරනු ලබන අවස්ථා, චාරිත්‍ර විධි හා පවත්වන ශාන්තිකර්ම හා ඩැක්කි ව්‍යුහය අනුව ද ඩැක්කි භාවිතයේ ප්‍රාදේශීය වෙනස්කම් දක්නට ලැබේ.

බළන්ගොඩ, බදුල්ල යන ශෛලීන් දෙකෙහි සහ අටකලන්පන්න ප්‍රදේශයේ භාවිත ඩැක්කි ව්‍යුහයේ පොදු සමානත්වයක් දක්නට ලැබේ. උඩරට සම්ප්‍රදායේ භාවිත උඩැක්කි ව්‍යුහය ඉහත ශෛලීන් හි උඩැක්කිය

නිර්මාණයට පාදක වී ඇත. උඩරට භාවිත උඩැක්කි කඳට වඩා විශාලත්වයකින් යුක්ත ව බළන්ගොඩ හා බදුල්ල ශෛලීන් හි උඩැක්කිය නිර්මාණය කරගනු ලබන අතර උඩැක්කිය සඳහා යොදනු ලබන ගැටිය ස්ථිරව ම පිහිටන පරිදි සකසා ගනී.

බළන්ගොඩ ශෛලිය | බදුල්ල ශෛලිය | අටකලන්පන්න ප්‍රදේශය

නමුත් කලවාන ශෛලියේ භාවිත ඩැක්කි ව්‍යුහය ඉහත සඳහන් උඩැක්කි ව්‍යුහයට වඩා ආකෘතිමය වශයෙන් වෙනස් අයුරකින් නිර්මාණය කර ගනී. ඒ පිළිබඳ මෙම මාතෘකාව විග්‍රහ කිරීමේ දී සාකච්ඡා කරනු ලැබේ.

බොල්තුඹේ සමන් දේවාලයේ පැවැත් වූ පහන්මඩු ශාන්තිකර්මයේ දක්නට ලැබූ ආකාරයට බළන්ගොඩ ශෛලියේ ඇඳුරන් විසින් මල වැඩමවීම, හාතා යක්කම, අඹ විදමන, දේවාභරණ විදීය වටා වැඩම කරවීම, ගී කියමන් සඳහා උඩැක්කිය වාදනය කරනු ලැබීය. බදුල්ල ශෛලියේ වැල්පැලදුම ශාන්තිකර්මයේ දී උඩැක්කිය ගායනාවන් සඳහා භාවිතා කරනු ලබනු ලබන බව ස්ටැන්ලි ශානික රුවන් පතිරණ ඇදුරුතුමා සමග කළ සාකච්ඡාවේ දී අනාවරණය විය. අටකලන්පන්න ප්‍රදේශයේ බුංගිරිය පත්තිනි දේවාලයේ පැවති පහන්මඩු ශාන්තිකර්මයේ ගී කියමන් ඉදිරිපත් කිරීම සඳහාත් දේවාභරණ වැඩමවන අවස්ථාවේ ඩැක්කිය භාවිතා කරනු ලැබීය.

සබරගමු නර්තන සම්ප්‍රදායේ කලවාන නර්තන ශෛලියේ ඇදුරන් මෙම වාද්‍ය භාණ්ඩය හඳුන්වනු ලබන්නේ "ඩැක්කිය" යන නාමයෙනි. කලවාන ශෛලියේ ගී මඩු ශාන්තිකර්මයේ මූලික ස්ථානයක් ඩැක්කි වාදනයට හිමි ව තිබේ. දාන මඩුව, ගම්මඩුව, දෙවොල් මඩුව, ගිනි මඩුව, පහන් මඩුව යන රංගන වෙන් වෙන් වශයෙන් පැවතිය ද මෙම රංගන සියල්ලෙහි ම චාරිත්‍ර විධි මෙම ගී මඩු රංගනයේ අන්තර්ගත වේ. ගී මඩු රංගනය අංග සම්පූර්ණ වීමට දාන මඩුව, දෙවොල් මඩුව, ගම් මඩුව, ගිනි මඩුව, පහන් මඩුව යන මඩු සියල්ලෙහි චාරිත්‍ර විධි අන්තර්ගත විය

යුතු ය. දින හතක් පුරාවට පවත්වනු ලබන ගී මඬු ශාන්තිකර්මයේ විශේෂ ස්ථානයක් කෝල්මුර ගායනාවන්ට හිමි වේ. මෙම ගායනාවන් සඳහා වාදනයට යොදාගනු ලබන්නේ ඩැක්කියයි. සබරගමු සම්ප්‍රදායේ භාවිත ඩැක්කිය පිළිබඳ හමුවන සාධක විරල වුවත් කලවාන දඹේමඩ පරම්පරාව සතුව පවත්නා 'මහමඬුපුරය' නැමැති පුස්කොළ අත්පිටපත ගී මඬුවේ ඩැක්කි භාවිතය පිළිබඳ තොරතුරු සපයයි.

උර පොටේ මුදි සිවිදු දලු සිටි ලකු පොටේ රැදි දෙවි දුරන්
බරකොතේ ඇන ලණු තනා සොද සවරිලා ගනු ඒ පියන්
වරපොටේ දා මලසේ සොද අත් පොටේ රැදි දෙවි දුරන්
නිලතුරේ රැදි මෙදිවියන්ගෙන් ඒ ඩැක්කිය ගෙන මුදුන්

ඩැක්කි උපත් කතා

ලෝකයේ බිහි වූ සියලුම අවනද්ධ භාණ්ඩයන් බිහිවීමෙහි ලා යම් උපත් කතාවක් දක්නට ලැබේ. එය යම් දේව කතාවක් හෝ මිත්‍යා කතාවක් හෝ යම් ආගමික පසුබිමක් මුල් කරගනිමින් බිහි වී ඇත. මෙරට භාවිත කරනු ලබන සියලුම වාද්‍ය භාණ්ඩයන් බෞද්ධ ආගමික මුහුණුවරකින් යුක්ත ව මෙරට දේශීය සංස්කෘතියට ගැලපෙන අයුරින් ගොඩනැගී ඇත. ඩැක්කියේ නිර්මාණය පිළිබඳව ඩැක්කි ජන සාහිත්‍යයේ සඳහන් වනුයේ බෝධි සත්වයන්ගේ බුද්ධත්වය වෙනුවෙන් වාදනය කිරීම සඳහා නිර්මාණය වූ බව යි.

ඉද විදු රසුන් පිට බුදු රැස් කඳ මේ තුන්ලොව විහිදු
බුදුන් බුදුවන මගුලට ඒ බුදු මගුලට අවු සැම දෙවිදු
ස්වර්ණ දෙවියෝ සිට ලා සුදු රත් නිල් සිරියල් මෙබදු
වාද තෝරා ගැසිය සිව්සැට ඒ සැදු ඩැක්කිය වන්නී දෙවිදු

ඩැක්කි චූර්ණිකාවේ ද මේ පිළිබඳව සඳහන් වේ.

නමෝ සත් සෙත් දෙන් සුගත් නෙත් සිත් කර මරුමන් බින්ද වූ සෙයින් කවුරුනී කමල ශ්‍රී නේත්‍රාධාර වූ මහාබ්‍රහ්ම රාජයෝ දුන් රන් කකුළු බෙරේද, උමයංගනාවෝ වැසෙන්නාවූ කුන්දනම් තාලමද, උප්පැන්නෙන් ගෙන පටන් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා රංවිදුරෙන් කර නමා දොළොස් අඟුල් බාගයක් උස රැගෙන්නාවූ කඳ දුන් කන්ද කුමාරයෝ ද, ගැටිවැල දුන් රාහු අසුරේන්ද්‍රයෝ ද, සම් ඇස් දුන් දල කුමාරයෝ ද, ලනුව

දුන් නාතේස්වරයෝ ද, සිව්වියත් උරපොටදුන් සුරගුරු ද, කයිලාසන සක්‍ර දිව්‍ය රාජයෝ වැසෙන්නාවු කුන්දනම් තාලමද, ගණදෙවියෝ දුන් වලලු දෙකද මෙසේ දසඅවතාරයකින් බබුළු බුබුළුවාගත් ඩැක්කිය පළමුව බුදුවරුන්ගේ බුදු මගුලට ගෙන්වා දළකුමරුවන්ගේ වම්උරේ දරාගෙන......

යනුවෙන් සඳහන් වේ.

මේ අයුරින් ඩැක්කිය නිර්මාණය වීම පිළිබඳ උපත් ගායනා වල සඳහන් වන අතර ඩැක්කියේ ව්‍යුහය ද එනම් යොදා ගන්නා ලද මෙවලම් ආදිය පිළිබඳව උපත් ගායනාවල සඳහන් වී ඇත. ඩැක්කියේ කොටස් නිර්මාණය කරදුන් දෙවිවරුන් මෙන් ම ඒ සඳහා අධිගෘහිත දෙවිවරුන් පවා ඩැක්කි උපත් ගායනාවන් හි සඳහන් වී තිබේ.

'ගජ දළින් ඉරු	වා	දුන් දෙවි	අසන්නේ
කියතකින් ඇණ වගුරු	වා	මන්කි පද	අසන්නේ
ලියවා රුසිරු	වා	වරද දුර	ලන්නේ
කඳක් දුන්නේ කන්ද කුමරු	වා	නාථ දෙවියන් ලනුව	දුන්නේ
අටිය වඩමින්	ඉදු	බුදිනා මෙන	ඉදුරා
තුටිය වඩමින්	උරනිදු	බුදිනා මෙන් තෙද	පැතිරා
ඇති වරදක්	විදු	එදැන ගත	වැතිරා
ගැටිය ලාගති රාහු	අසුරිඳු	බඳින උරපොට දුනි	සුරගුරා
බුදු මගුලට	එදා	රත්තරනින්	රතා
රුස් වු දේව	සමුදා	තබමින් එරන්	නියතා
දළ කුමරිඳු	එදා	වලලු දෙක	පැවතා
එසක් සම් දෙක දුන්නු	සාදා	එදා දුන්නේ ගණ	දේවතා
පද රසය	වින්දේ	පත්තිනියන්	රැගෙන
රෝ දුක් දුරැර	සින්දේ	තම ළඟට	කැඳවාගෙන
විස්කම්	දෙවින්දේ	සුභ	ආවඩාගෙන
ගිගිරි තාලම් පටය	දුන්නේ	ඩැක්කිය එවිට	පාවාගෙන

කලවාන ශෛලියේ ඩැක්කි ව්‍යුහය

කලවාන ශෛලියේ භාවිත ඩැක්කිය නිර්මාණය කිරීමේ දී ඒ සඳහා ගසක්

තෝරා ගැනීමේ සිට ඩැක්කිය නිර්මාණය කිරීම දක්වා චාරිත්‍ර විධි රාශියක් දක්නට ලැබේ. ඒ පිළිබඳ ඩැක්කි සාහිත්‍යයේ සඳහන් වනුයේ,

සතරවරම් දෙවි දක   විගසින්නේ
රුසිරු මිල්ලයක් දක   විගසින්නේ
සත් දවසක් ගස පේ   කරවන්නේ
විස්ම කර්මයා එහි   ගෙන්වන්නේ

යනුවෙනි. අදාළ වත්පිළිවෙත් සිදු කිරීමෙන් පසු සුබ වේලාවෙන් වෘක්ෂය කපාගනු ලැබේ. මෙසේ වෘක්ෂය කපාගැනීමෙන් පසු ඩැක්කිය සකස් කිරීම සඳහා කඳ, කොටස් කළයුතු ප්‍රමාණය ඩැක්කි ජන සාහිත්‍යයේ සඳහන් වේ.

එදාම අළුයම මිල්ල   කපාලා
එදාම ඒ කඳ දිග ගෙන   මැනලා
දොලසඟුලක් කඳ දිග ගෙන   මැනලා
පසඟුලකට කඳ පා ගති   මැනලා

ඒ අනුව ඩැක්කිය නිර්මාණය කිරීම සඳහා තද දැව වර්ගයක් යොදාගෙන සකස්කර ගනී. ඩැක්කි කඳෙහි දිග ප්‍රමාණය 'අඟල් දොළසකි'. ඩැක්කි ඇසෙහි විෂ්කම්භය ලෙස සඳහන් වනුයේ 'අඟල් පහකි'. උඩරට හා පහතරට උඩැක්කියට වඩා මදක් විශාල ය. සම්මත

ඩැක්කි කඳ

ඩැක්කියේ ආකෘතියට අනුව සකස් කරගත් කඳෙහි ගෙල ඩැක්කියේ ඇස ප්‍රමාණයට වඩා සිහින්ව සකසා ගනී.

ගැටිය නිර්මාණය කිරීමේ දී ඒ සඳහා වේවැල් යොදාගනු ලබයි. වේවැල් පලා හොඳින් සමතලා වෙනතුරු හොඳින් සැස සකස් කරගත් පතුරු හතක් සකසාගෙන එය එකක් මත එකක් එලා කුඩා ඇණ මගින් එකට යා කරනු ලබයි. මේ පිළිබඳව ඩැක්කි සාහිත්‍යයේ සඳහන් වනුයේ,

ගැටිය ගෙන සත්පොට
ඇණ සය ගසා එක්කොට
සත්යොදුන් සියයකට
මවාලා දුනි විස්ණු දෙවිඳුට

යනුවෙනි. අනතුරුව වේවැල් වෘත්තාකාර හැඩයකට නවා කෙලවර දෙක අල්ලා එකිනෙකට සම්බන්ධ කොට ඇණ ගසා වෘත්තාකාර රවුමක් නිර්මාණය කරගනී. 'ගැටිවැල' ලෙස හඳුන්වනු ලබන්නේ එකී වෘත්තාකාර රවුම යි. මෙකී වළල්ල ඩැක්කියේ මුහුණතට පහසුවෙන් බැස්සවිය හැකි ආකාරයෙන් ද ඩැක්කි මුහුණතට වඩා අඟලක් පමණ පිටතට නෙරා සිටින්නට සකස් කළ යුතු ය.

සම සහිත ගැටිවළල්ල

ලණුව යෙදූ ගැටිවළලු දෙක

ජලයේ පොඟවාගත් බෙර සිවිය ගැටි වළල්ල මත එලා රැලි නොසිටන සේ ඇද යටි පැත්තෙන් සිර කරනු ලැබේ. අනතුරුව හොඳින් නැමෙන සුළු වේවැල් පටක් ගැටියෙහි යටි පැත්තට සිර කරනු ලබන්නේ සම ගැටි වළල්ලෙන් ගලවා ගන්නට ය. ඩැක්කි ඇස වාදනය නොකරන අවස්ථාවලදී ලිහිල් කොට තැබීම හෝ ගලවා තැබීමට හැකිවන පරිදි සකස් කිරීම මෙම ඩැක්කියේ සුවිශේෂී ලක්ෂණයකි. වේවැල් ගැටිය මත සවිකළ ඩැක්කි තට්ටුව ඩැක්කි කඳට සම්බන්ධ කරනු ලබන්නේ සිහින් නූලකිනි. එක් ඩැක්කි තට්ටුවකට සිදුරු අටක් විදිනු ලබයි. මෙකී සිදුරු කුඩාවට විදගත යුතු අතර සමාන දුරකින් සකසා ගත යුතු ය. තට්ටු දෙකේ ම මෙසේ සිදුරු විද ගැනීමෙන් පසුව ඒ සිදුරු අතරින් කතිර හැඩයට නූල් යොදා තට්ටු දෙක ඩැක්කි කඳට සවිකර ගනු ලැබේ.

උරපටිය සහිත ඩැක්කිය

ගිගිරි වළලු

ඩැක්කිය වාදනය කරනු ලබන්නේ කරේ එල්ලාගෙන ය. කරේ එල්ලා ගැනීම සඳහා භාවිතා කරනු ලබන පටිය හඳුන්වනු ලබන්නේ 'උරපටිය' යනුවෙනි. ඩැක්කිය සඳහා යොදාගනු ලබන උරපටියේ දිග ප්‍රමාණය 'සිව්වියතක්' ලෙස සඳහන් වේ. මේ පිළිබඳව *ඩැක්කි චූර්ණිකාවේ*,

> ... කඳ දුන් කන්දකුමාරයෝ ද, ලනුව දුන් නාථදේවේන්ද්‍රයෝ ද, සිව්වියත් උරපොටදුන් සුරගුරුද, ගණදෙවියෝ දුන් වළලු දෙක ද මෙසේ දස අවතාරයකින් බබුළු බුබුළුවාගත් ඩැක්කිය...

යනුවෙන් සඳහන් වේ.

ඩැක්කි වාදන ක්‍රම

අනෙකුත් දේශීය උඩැක්කි වාදනයන් හි මෙන් ම කලවාන ඩැක්කි වාදනයට ඊට පොදු වූ වාදන විලාසයක් දක්නට ලැබේ. මෙම ඩැක්කිය ගායනාවන්ට අදාළව වාදනය කිරීම සඳහා යොදාගෙන ඇති බව පෙනේ. ඩැක්කි වාදනයේ දී මූලික බීජාක්ෂර හතරක් වෙයි. එනම් තකු, දිකු ,තොං, නං වේ. ඒ පිළිබඳව ඩැක්කි සාහිත්‍යයේ ද සඳහන් වේ. ඩැක්කි චූර්ණිකාවේ සඳහන් වනුයේ,

> ... පළමුව බුදුවරුන්ගේ බුදුමගුලට ගෙන්වා දළකුමරුවන්ගේ වම්උරේ දරාගෙන තකු, දිකු ,තොං,නං යන පදයක් ගැසූ ඩැක්කිය අදත් මෙම රංග මණ්ඩපයට ගෙන ආ වීනම් මේ ආතුරයන්හට සුභ වැඩක් සුභ සිද්ධියක් වේවා...

යනුවෙනි.

මෙසේ මූලික බීජාක්ෂර වාදනය කිරීමේ දී වාදනය කරනු ලබන විලාසය ඩැක්කි වාදනයේ දී වැදගත් වේ.

'තකු' අක්ෂරය

"ත" අක්ෂරය

සබරගමු ඩැක්කි වාදනයේ දී ' තකු ' අක්ෂරය වාදනය කරනු ලබන්නේ 'ත' අක්ෂරය වෙනමත් 'කු' අක්ෂරය වෙනමත් ගෙන එකට වාදනය කිරීමෙනි. 'ත' අක්ෂරය වාදනය කිරීමේ දී දකුණතෙහි මහපොට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර ම ඩැක්කි ඇසෙහි මධ්‍යයට මදක් ඉහලට වදින ලෙස ගැසිය යුතු ය. මෙහිදී සුලැඟිල්ල, මැදැඟිල්ල හා වෙදැඟිල්ල නිසි ආකාරයට ඩැක්කි මුහුණතට වැදීමෙන් දබර ඇඟිල්ල යන්තමින් ඩැක්කි ඇසෙහි හමට ස්පර්ෂ වීමත්, ඇඟිලි ස්පර්ශ වීමත් සමඟ අත ඉවතට ගැනීම සමගින් හඬ විවෘත වීම මගින් 'ත' අක්ෂරය උපදී. මෙහිදී වම් අත මගින් තට්ටුව බුරුල් කිරීම සිදු වේ.

'කු' අක්ෂරය

'කු' අක්ෂරය වාදනය කරනු ලබන්නේ දකුණු අතෙහි දබරැඟිල්ල උපයෝගි කොට ඩැක්කි ඇසෙහි මධ්‍යයට මදක් පහළ කොටසට ගැසීම මගිනි. මෙහිදී වම් අත මගින් වර තද කිරීමෙන් 'කු' අක්ෂරය නිපදවා ගනු ලැබේ.

'දිකු' අක්ෂරය

'දිකු' අක්ෂරය වාදනය කිරීමේදී 'දි' අක්ෂරය සහ 'කු' අක්ෂරය වෙන ම වාදනය කරනු ලැබේ. 'දි' අක්ෂරය වාදනය කරනු ලබන්නේ මාපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි තුන ම ඩැක්කි ඇසෙහි ඉහළ කොටසට ගැසීම මගින් 'දි' අක්ෂරය උපදවා ගනු ලබයි. මැදැඟිල්ල හා වෙදැඟිල්ල ඩැක්කි ඇසට හොඳින් ස්පර්ශ වේ. මෙහිදී 'තත් ' අක්ෂරය මෙන් අත හමට වැදීමෙන් පසු අත ඉවතට නොයන අතර ඩැක්කි ඇසට හඬ විවර වන්නට අත ඉවතට නොගනී. මෙහිදී වම් අත උපයෝගී කර ගනිමින් වර බුරුල් කිරීමක් සිදු වේ. 'කු' අක්ෂරය වාදනය කිරීමේ දී ඉහත

'කු' අක්ෂරය වාදනය කළ අයුරින් වාදනය කරනු ලැබේ. මෙම අක්ෂර දෙක එකට වාදනය කිරීමෙන් 'දිකු' අක්ෂරය වාදනය කරනු ලබයි.

'තොං' අක්ෂරය

'තොං' අක්ෂරය වාදනයේ දී දබර ඇඟිල්ල උපයෝගී කොට ඩැක්කියේ පහළ කොටසට අත යන සේ ගසන අතර ඩැක්කි ඇසට අත යනවාත් සමඟ ම වර බුරුල් කිරීම සිදු කරනු ලැබේ.

'නං' අක්ෂරය

'නං' අක්ෂරය වාදනය කරනු ලබන්නේ සුලැඟිල්ල, මැදැඟිල්ල හා වෙදැඟිල්ල උපයෝගී කොට ගනිමින් වම් අතින් වර තද කිරීම මගින් ඩැක්කි ඇසෙහි උඩ කොටසෙහි වදින්නට සැලැස්වීමෙන් 'නං' අක්ෂරය උපදවා ගනු ලැබේ.

මූලික බීජාක්ෂර වාදනයට අමතරව ඩැක්කිය මගින් ගර්භාක්ෂර වාදනය කරනු ලබයි. ජිං, කි, ට, ක, කු, ග ආදී අක්ෂර වාදනය කරනු ලබයි. මෙම ඩැක්කි වාදනයේ දී ක, ග අක්ෂර ඩැක්කියේ ඉහළ කොටසටත් ජිං, ට, කු, ක අක්ෂර ඩැක්කියේ පහළ කොටසටත් අතැඟිලි වදින්නට සැලැස්වීමෙන් එකී අක්ෂරවලට අදාල ධ්වනිය උපදවා ගැනීමට කටයුතු කරයි. ' ජිං ' අක්ෂරය වාදනය කිරීමේ දී දබර ඇඟිල්ල යොදා ගනිමින් වමතින් වර තද කිරීමෙන් ඩැක්කි ඇසෙහි පහළට ගැසීම මගින් හඬ උපදවා ගනී. 'ක' අක්ෂරය වාදනය කරනු ලබන්නේ ඉහත සඳහන් කළ ආකාරයට ම දබර ඇඟිල්ල යොදා ගනිමින් ඩැක්කි ඇසෙහි පහළ කොටසට ගැසීමෙනි. මෙහිදී ඩැක්කියේ වර බුරුල් කරනු ලැබේ.

'ට' අක්ෂරය වාදනය කරනු ලබන්නේ ද දඹර ඇඟිල්ල යොදා ගනිමින් වර බුරුල් කරමින් ඇසේ පහළ කොටසට ගැසීමෙනි.

මේ අයුරින් මූලික ගර්භාක්ෂර වාදනය කරනු ලැබේ. ගර්භාක්ෂර යොදා ගනිමින් සරඹ අභ්‍යාස කිහිපයක් වාදනය කරනු ලබයි.

1. තරිකිට
2. දිරිකිට
3. තරිකිට දිරිකිට
4. තත් තරිකිට
5. දිත් දිත් දිරිකිට
6. කිට ජෙං
7. තක්කිට කිට ජෙං
8. දික්කිට කිට ජෙං

මේ ආදි වශයෙන් සරඹ ප්‍රගුණ කළ යුතු ය. එමෙන්ම ගර්භාක්ෂර යොදා ගනිමින් වාදනය කරනු ලබන සරඹ ද දක්නට ලැබේ.

1. දොංත තකට
2. ජිං කිට තත් තත් කිටිතක
3. දොං තත් තත් කිටිතක
4. ජිංත ගතා දොං
5. කුදත් තක්කිට තකට ජිම්කිට

ආදී සරඹයන් වාදනය කරනු ලබයි. එක් එක් වාදකයාගේ දක්ෂතාව අනුව විවිධ තාල අනුව පද වාදනය කරමින් ශිල්පය ප්‍රගුණ කරනු ලැබේ. මෙසේ පද කොටස් වාදනය කිරීමේ දී ගායනයේ අර්ථාන්විතභාවය හා මිහිරිතාව මෙන් ම ගායනයට හානියක් නොවන පරිදි ඩැක්කිය වාදනය කළ යුතු ය. වර තද කිරීම හා බුරුල් කිරීම මගින් නියමිත අක්ෂර උත්පාදනය කිරීම මෙකී වාදන කලාව ප්‍රගුණ කිරීම මගින් ලබාගත යුතු දෙයකි. එක් එක් තාලයන්ට අදාළ අලංකාර පද වාදනය කිරීම වාදන ශිල්පියාගේ දක්ෂතාව මත සිදුවන්නකි.

කලවාන ශෛලියේ ඩැක්කිය භාවිත අවස්ථා

කලවාන නර්තන ශෛලියේ ගී මඩු ශාන්තිකර්මයේ මඩු බැසීමෙන් ආරම්භ වූ දෙවන අදියරේ පූජාකර්මයේ දී දේව කෝල් පාඩුව නොහොත් දෙමළ කෝල්පාඩුව, මුදුන් තාලය, හත් පද පෙළපාලිය, යහන්දැක්ම,

හීන්තාලම නටා අවසන් වීමෙන් පසු පත්තිනි තොරණ ඉදිරිපිට පැදුරක් එලා ඒ මත පිරුවටයක් එලා, ඒ පිට ඩැක්කි සියල්ල තබා කෙටි යක්කමක් ආරම්භ කරයි. කපු මහතා හා වාදකයා අතර ඇතිවන දෙබසක් ආශ්‍රයෙන් ඩැක්කිය හඳුන්වා දීමට සලස්වයි.

කපු මහත්තයා ඃ ගුරුන්නාන්සේ

වාදකයා ඃ ඔව්

කපු මහත්තයා ඃ මොකද්ද මේ හුබහක් වගේ තියෙන්නේ

වාදකයා ඃ අම්මප ඔව්. මේක හුබහක් තමා.

කපු මහත්තයා ඃ මේකේ නයි එහෙමත් ඇති බාගදා. කියමින් ඇඟිල්ලෙන් ඇන බලයි.

වාදකයා ඃ හා හා අල්ලන්න එපා. (කපු මහතා පස්සට පනියි. එවිට තවත් ශිල්පියෙකු පැමිණ,) මොකක් උනත් ළඟට යන්න එපා. බෝම්බයක් ද දන්නේ නැනේ

කපු මහත්තයා ඃ අම්මප ඔව් එහෙනම් පොලීසියටවත් කියමු.

වාදකයා ඃ නෑ නෑ මට පෙන්නේ මේක හුඹහක් තමයි (මෙසේ වාද විවාද කර ගනියි)

කපු මහත්තයා ඃ මොකක් උනත් කමක් නෑ. කෝටුවකින් අපි මේක කාල් ගාලා බලමු.

වාදකයා ඃ කාල් ගාන්න කැඳ හැලියක් ද මේක. (බලමු කියා කපු මහතා කෝටුවක් ගෙන රෙදි පටක් අයින් කරන්නට සැරසෙයි.)

ශිල්පියෙක් ඃ හා හා නයා නයා (කපු මහතා පස්සට පනියි. කපු මහතා නැවත කෝටුවෙන් අවුස්සා ඩැක්කි හා ගිගිරි වළලු පාදා ගනියි.)

කපු මහත්තයා ඃ දෙයියෝ සාක්කි

වාදකයා ඃ තට්ටු පිට තට්ටු

ශිල්පියෙක් ඃ (හොඳින් සෝදිසි කර බලයි.) මොනවද තව පොල් වළලු වාගේ ජාතියකුත් තියනවා. (මේ අවස්ථාවේ සියළු දෙනා එබී බලති.)

වාදකයා ඃ ඇහි බැම දෙකකුත් තියනවා. මෙතන තියෙන්නේ පොල් වළලුයි, හකුරුයි.

කපු මහත්තයා ඃ (අතට ගනිමින් තට්ටු කරමින් විපරම් කර බලයි.)
මේ පොල් වළලු නෙමෙයි. මේ තමයි ඩැක්කිය. මේ තියෙන්නේ ගිගිරි වළලු. මේ තියෙන්නේ තාලම්පට.

මේ අයුරින් යක්කම අවසානයේ ඩැක්කිය අතට ගනු ලබන්නා වූ නර්තන ශිල්පීන් ඩැක්කි උපත චූර්ණිකා ආදිය ගායනා කිරීම සිදු කරනු ලබයි. මේ අතරතුර ඩැක්කියේ කොටස් එකිනෙකට සම්බන්ධ කර ගනී.

කලවාන ශෛලියේ ඩැක්කිය භාවිතා කරනු ලබන අවස්ථාවක් වනුයේ හාතා යක්කම නමින් හඳුන්වනු ලබන නාට්‍යයමය අවස්ථාව සඳහා ය. එනම් හාතා යක්කම නමින් හඳුන්වනු ලබන්නා වූ නාට්‍යයමය අවස්ථාව ඉදිරිපත් කිරීමට පෙර හාතා යක්කමට අදාල කවි ගායනා ඩැක්කිය වයමින් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි. හාතා යක්කම නම් අවස්ථාව මගින් ඉදිරිපත් කරනු ලබන්නේ මඩු පුරාවෘත්තය යි. සේරමාන් රජුට වැළඳුණු හිස රුජාව සුව කිරීම පිණිස විවිධාකාර ප්‍රතිකර්ම කළ ද සුවයක් නොලැබීමේ කතා පුවත මෙහිදී ගෙනහැර දක්වයි. අවසානයේ මේ සඳහා මඩු ශාන්තිකර්මයක් කළ යුතු බවත් ඒ සඳහා මඩු භූමිය සැකසීම හා මඩුව තනන ආකාරය පිළිබඳ කවි යක්කමේ ගායනාවන් මගින් ඉදිරිපත් කෙරේ. කවි ගායනා ඉදිරිපත් කිරීමෙන් පසුව හාතා යක්කම නමින් හඳුන්වනු ලබන නාට්‍යමය සංවාදය ඉදිරිපත් කරයි.

කලවාන ශෛලියේ ඩැක්කි භාවිතා කරන අවස්ථාවක් වනුයේ පාවඩ නර්තනය යි. ගී මඩු ශාන්තිකර්මයෙහි 'පාවාඩය' නර්තනයට විශේෂ ස්ථානයක් හිමි වේ. පාවාඩ නර්තනය ශාන්තිකර්මයන්ගේ මූලික අංගයක් වී තිබූ බව මහමඩුපුරය පුස්කොළ අත්පිටපතෙහි සඳහන් ගායනා මගින් තහවුරු වේ.

දියත පුරතර නිරිඳු මැතිගෙන සෙනඟ සේ සිව් රඟ විත්
නියත මැතියෙන් සොඳුරු අත තැබූ මෙහැම යක් දෙසු මඟුල් දුරන්
නියතයෙන් සොඳ සොඳුරු යක් දෙසු කියා මේ කවි කෝල් මුරයෙන්
කියන ඒ පාවාඩයේ සිට ගසා ඩැක්කිය පුරුදු සුරලත්

විශේෂයෙන් ශාන්තිකර්ම අවස්ථාවේ දී 'පාවාඩය' පෙළපාලි අවස්ථාවක් ලෙස භාවිතා කරනු ලබයි. 'කපු නැටුම' යනුවෙන් හඳුන්වන ලබන පාවාඩ නැටුම අතීතයේ දී ප්‍රධාන කපු මහතාට අයත් කාර්යයක් වේ. පාවාඩය නැටීමේ චාරිත්‍ර විධි අවස්ථාව හලං වඩමවා ඇති ප්‍රධාන පත්තිනි තොරණ ඉදිරිපිට සුදු පිරුවටයක් එලා ඩැක්කි ගසමින් අදාළ ගායනා සිදු කරමින් ප්‍රධාන කපු මහතා විසින් ම නටනු ලබයි. මෙහිදී කලවාන සම්ප්‍රදායේදී පාවාඩ නැටුම සඳහා ප්‍රථමයෙන් ශ්ලෝක ගායනා

කර කෙටි අඩු කෝල් පදයක් නටනු ලැබේ. පසුව පියවිල්ලට ගොඩවීම සඳහා අවසර ලබා ගැනීමට කවි ගායනා කරයි.

ගිනි පත්තිනි දෙවියන් නේ
ගිනිජළ වට විහිදෙන් නේ
මේ මැත්දුන් රැක දෙන් නේ
පාවඩ අවසර දෙන් නේ

කවි ගායනයෙන් පසු පාවාඩ ශ්ලෝකය ගායනා කරනු ලබයි.

සව් සිරින් පිරි ත්‍රිලෝක නාදයෙන් සුගත් ත්‍රි තුන් ලොවට අදීඩබානු බල පෑ තේජසින් ඔද බිඳ ජයගත් ශ්‍රී ලංකාවට සුගත් මුණිදුගේ නමෝ මුනි සරණය, සව් සිරින් පිරි අනේක ආශ්චර්යයෙන් අසිදිස වූ තුන් ලොවට අදීඩබානු තේජසින් පෑ රුවන්ගිරි මුචලින්දයන් වැනි බද්‍ර කටකයෙන් සදිශ්‍ර වූ අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයන් වහන්සේ තුදුස්රියන් වජ්‍රාසනාරූඪව වැඩ ඉඳගෙන නීලය, පීතය, ලෝහිත ඕදාත, මාන් ජේඨාප්‍රභාමේෂ්වරයයි යන සවනක් ගන බුද්ධ රැස්මින් මාලාවක් දස දිසාන්ත්‍රයට විහිදුවමින්...

මෙසේ පාවාඩ ශ්ලෝකය අවසානයේ අඩුකෝල් පදය නටා පියවිල්ලට නගිනු ලැබේ. පාවඩයේ සිට ඩැක්කිය ගසමින් මුල් මාත්‍රයට අනුව කවි ගායනා කරනු ලැබේ.

එදා ඒ කාවේරි ගඟ බැස යන්ට බැරි තද වතුර සින්ද්‍ර
එවිට පත්තිනි තෙද විකුම් පා දමුව අත තිබු එනර මුද්ද්‍ර
එවිට දිය කඳ දෙකට බෙදමින් නැගි සුදු වැලි ඉවුරු බින්ද්‍ර
එවිට මන මේකලා ඇවිදින් අතුල පියවිලි පිටට නැග්ගා

මෙසේ කවි ගායනා කර එම මාත්‍රයට අදාළ අඩව් නැටීම සිදු කරනු ලබන අතර පසුව පාවඩයේ සිට පහත කවි ගායනා කරනු ලබයි.

පළමු මෙ කප බඹ උපතෙහි පිරි ජලය එක ලෙසිනේ
බලනු නෙත්ති ඇති නැති සැටි සැම දෙවිඳු රැස් වෙමිනේ
ලවමි නෙලුම් භූමය ගෙන බ්‍රහ්ම රාජ සිට එතනේ
මැවූ නෙලුම් ජල මතුපිට දේව චින්තනෙන් එදිනේ

කවි ගායනයෙන් පසු අත් වැදුම් සහිත නමස්කාර පද කොටසක් ඉදිරිපත් කරනු ලබන අතර පද කොටස හමාර වීමත් සමග පාවාඩයෙන් බැසීම සඳහා කවි ගායනා කරනු ලබයි.

පාවාගෙන මිණි සළඹ ත්
පාවාඩය පිට සිටිය ත්
මේ යාග කල යහප ත්
පාවාඩයෙන් බිමට බසි ත්

පාවඩයෙන් බැසීමට අවසර කවි ගායනයෙන් පසු අඩු කෝල් පදය නටා පාවාඩයෙන් බිමට බැසීමෙන් පසු පාවාඩ නර්තනය අවසන් වේ.

ගී මඩු ශාන්තිකර්මයේ රඟ දක්වන කෝල්මුර ගණනින් තිස් පහක් වේ. මෙම කෝල්මුර එකිනෙකට සම්බන්ධ වූ ප්‍රවෘත්ති තුනකින් සමන්විත වේ. ඉන් ප්‍රධාන කතා පුවත වන්නේ පත්තිනි පාළඟ කතා පුවත වේ. දෙවැන්න වුයේ පඬි රජුගේ කතා පුවත වන අතර තෙවැන්න වුයේ කරිකාලන් නැමති සොලී රජුගේ කතා පුවත යි. මෙම ගී මඩු ශාන්තිකර්මයේ ප්‍රායෝගිකව යෙදෙන විට මුලික වන්නේ මෙම පත්තිනි පාළඟ කතා පුවත යි. පත්තිනියගේ අරමුණ, විවාහය, පාළඟ දුරාචාරයට යොමු වීම, ධන විනාශය, සළඹ විකිනීමට යෑම, පඬි රජුගේ උදහසට ලක්වීම, පාළඟ මැරවීම, , පාළඟ ඉපැද්දීම, මදුරාපුර ගිනිබත් කිරීම හා සුවපත් කිරීම, මදුරුමාල පත්තිනි උපත ආදිය එකිනෙකට සම්බන්ධ කතාවලින් මෙම පන්තිස්කෝල්මුර සමන්විත වේ. විශේෂයෙන් මෙම පන්තිස්කෝල්මුර නාට්‍යානුසාරී රංගන අවස්ථා වේ. දින හතක් පුරා පවත්වනු ලබන ගී මඩු ශාන්තිකර්මයේ කෝල්මුර තිස්පහ ම රඟ දක්වනු ලබයි. කලවාන නර්තන ශෛලියේ භාවිත දඹේමඩ පරම්පරාව සතු පන්තිස් කෝල්මුර පහත දැක්වේ.

යහන් සැහැල්ල	කැටකිරිල්ලියගේ විත්තිය
විසිතුරු කතාව	කටුස්සාගේ විත්තිය
පාඩි නළුව	දරකැටියාගේ විත්තිය
අඩ නළුව	හාවාගේ විත්තිය
දන් කඨිනය	මැඩියාගේ විත්තිය
පහන් ගැඹුර	කොබෙයියාගේ විත්තිය
පතහෙ කතාව	ගමන් වලි නඩය
සොලීපුර සාගතය	පඬිපුර ගිනි ගැසීම
මඩු විස්තරය	සත් පත්තිනි කතාව
විත්ති බැඳීම	පාළඟ මැරීම
අවවාද විත්තිය	ඉපැද්දීම
එළදෙන විත්තිය	අඹ විදමන

කන්නුරන් කතාව	පත්තිනි වැලපීම
සළඹ විකිනීම	මහා දෙවොල් බාගේ
පඬිපුර ගිනි ගැසීම	සළඹ සොරාගෙ කතාව
බාදා වලි නඩය	අංකොට හටන
පත්තිනි කයීනය	කුඩා දෙවොල් බාගේ
ගජබා කතාව	

පන්තිස්කෝල්මුර රඟදක්වන අවස්ථාවේ වාදනය කරනු ලබන්නේ ඩැක්කිය වේ. නර්තන ශිල්පීන් ගායනාවන්ට අනුකූල වන අයුරින් ඩැක්කි පද වාදනය කරනු ලැබේ.

දොංත තකට
ජිංත ගතා කුද
කුදක් තක්කිට තකට ජිමිතක

ආදී ඩැක්කි පද බහුල වශයෙන් යොදා ගැනීම දක්නට ලැබෙන අතර අදාළ කවියට අනුව ඩැක්කි පද අලංකාර සහිතව වාදනය කිරීම ඒ ඒ නර්තන ශිල්පියාගේ දක්ෂතාව අනුව සිදුවන්නකි.

කලවාන ශෛලියේ ඩැක්කි භාවිත පරම්පරා

කලවාන නර්තන ශෛලියේ ශාන්තිකර්ම අවස්ථාවලදී ඩැක්කිය භාවිතා කරනු ලබන්නේ ඉතාමත් සීමිත පරම්පරා කිහිපයක පමණි. විශේෂයෙන් මෙම ඩැක්කි වාදනය කිරීම සඳහා ප්‍රධාන වගකීම පැවරී තිබුණේ ප්‍රධාන කපු මහතා ඇතුළු ගී ඇදුරන් හා ගී අඟනුන් වෙතට ය. ගී කියමන් ඉදිරිපත් කිරීම සඳහා ගී ඇදුරන් සහ ගී අඟනුන් සහභාගී වන අතර ඔවුන් අත්වැල් ගායනයෙන් සහ තාලම්පට වාදනයෙන් සහය වේ. ඩැක්කි සැරසිල්ල පුස්කොළ ග්‍රන්ථයේ ඩැක්කි වාදනය ගී ඇදුරන් මුල්කර ගනිමින් සිදුකර ඇති බව දක්වේ.

උඩැක්කිලා	තර
එබිසෝ පදිය	ඉදිරිකොට
ගී ඇදුරු	මුල් කොට
දේවගණ සොබවන්	ආතුර

යනුවෙනි.

මඩුපුර ගායනාවන් හී

සෙත් මුලිනි ඉදුරා
උවදුරු පඩුරු උදුරා
ගී කියන ඇදුරා
සිතත් දෙවියන්සේම ඇදුරා

විශේෂයෙන් මෙම ඩැක්කි වාදනය සඳහා ගී ඇදුරන් හා ගී අඟනුන් තෝරා ගැනීම අදාළ විශේෂ දේහ ලක්ෂණ රාශියක් මහමඬුපුරය පුස්කොළ අත්පිටපතෙහි සඳහන් වේ.

පිනුත් නොකළ මව්පියන් නොදන වැඩුණු නොකී කරුත්
